**www.wsws.org**

**ලෝක සමාජවාදී වෙබ් අඩවිය**

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

## ලෝක ධනේශ්වර ක්‍රමයේ දේශපාලන සහ ආර්ථික අර්බුදය පිලිබඳ සටහන්

# 2009 වර්ෂයේ දී සමාජවාදී සමානතා පක්ෂයේ ඉදිරිදර්ශනයන් හා කර්තව්‍යයෝ

**Notes on the political and economic crisis of the world capitalist system**
**Perspective and tasks of the Socialist Equality Party in 2009**

**ඩේවිඩ් නෝර්ත් සහ ජෝසප් කිෂෝර් විසිනි**
**2009 ජනවාරි 13**

*පහත සඳහන් වාර්තාව ඇමරිකා එක්සත් ජනපදයේ මැද-බටහිර ප්‍රදේශයේ සමාජවාදී සමානතා පක්ෂ සාමාජික රැස්වීමකට ඉදිරිපත් කරන ලදී. රැස්වීම පවත්වන ලද්දේ ජනවාරි 10 දා මිචිගන්හි ඈන් ආබර් නගරයේදී ය. ඩේවිඩ් නෝර්ත් සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික සභාපති වන අතර, ජෝසප් කිෂෝර් සසප ජාතික ලේකම්වරයා වේ.*

1. 2009 වර්ෂයට ඇතුලුවත්ම මිනිස් වර්ගයා මුහුන දෙන්නේ මෙම සියවස ආරම්භයේ දී පැතිර පැවති සාමය සහ සමෘද්ධිය පිලිබඳ මිථ්‍යාවන් කෲර ලෙස බිඳ දමන්නා වූ තත්වයන්ට ය. දැන් මුලු මහත් ලෝකය ම ගිලී පවතින්නේ ඓතිහාසික මහා ව්‍යසනයක පරිමාව වේගයෙන් අත්පත් කර ගනිමින් සිටින්නා වූ ආර්ථික අර්බුදයක් තුලය. උග්‍රව නැගීගෙන එන ආර්ථික වියවුලකට මැදිවී සිටින්නාවූ අධිරාජ්‍ය බලවතුන්ගේ හැසිරීම එලිපිටම සාපරාධී ස්වභාවයක් දරන්නට පටන් ගෙන තිබේ. ගාසා තීරයේ අනාරක්ෂිත ජනතාව මත හෙලනු ලබන බෝම්බ හා කාලතුවක්කු උන්ඩ වරුසාව, සිහියට ගෙන එන්නේ ස්පාඤ්ඤ සිවිල් යුද්ධයේ දී ගුවර්නිකාව සහ වෝර්සෝ ගෙටෝව ට එල්ල කරන ලද නාසි මෘගත්වයයි. ගනන් නැති ඉරාක සහ ඇෆ්ඝනිස්තාන වැසියන් දහස් ගනන් මරා දැමීමට කෙලින් ම සම්බන්ධ වී ගෙන සිටින ඇමරිකානු අධිරාජ්‍යවාදය ඉස්රායල් තන්ත්‍රයේ අපරාධවලට පරිපූර්න සහායක් ලබා දෙයි. "පහත් හා වංචනික ය"යි ඕඩන් නමැති කවියා විසින් 1930 ගනන් පිලිබඳව කරන ලද විස්තරය ඊට නොඅඩුව 21 වන ශතවර්ෂයට ද ගැලපේ. එහෙත් දේශපාලන මිථ්‍යා විශ්වාස බිඳ වැටීම ඥානය අත් කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය කාරනයක් ද වෙයි. ඉතිහාසය (එනම් ධනවාදයට සහ අධිරාජ්‍යවාදයට එරෙහි පන්ති අරගලය) අවසාන වී ඇතැයි යන ව්‍යාජ කතා නව ශතවර්ෂයේ ප්‍රාරම්භක වර්ෂවල අත්දැකීම විසින් නිෂ්ප්‍රභා කර දමනු ලැබ ඇත. වඩාත් හොඳින් පැහැදිලි වන කරුන නම් එක්සත් ජනපදයේ ද ජාත්‍යන්තරව ම ද කම්කරු පන්තිය විප්ලවවාදී අරගලවල නව යුගයකට පිවිසෙමින් සිටින්නේ ය යන්න යි.

## 2008 බිඳ වැටීම

2. මෙයට හරියටම එක් අවුරුද්දකට පෙර, 2008 වර්ෂය තුල "ලෝක ධනේශ්වර පද්ධතියේ ආර්ථික හා දේශපාලන අර්බුදයේ අර්ථභාරී උග්‍රවීමක්" සිදුවනු ඇතැයි සමාජවාදී සමානතා පක්ෂය ප්‍රකාශ කර සිටියේ ය. උග්‍රවෙමින් පැවති නය අර්බුදයේ ගම්‍යයන් විශ්ලේෂනය කල සසප පහත සඳහන් කරුන අවධාරනය කලේය. "ලෝක මූල්‍ය වෙලඳපලවල් තුල පැනනැගී ඇති කලබැගෑනිය වනාහී හුදෙක් අනුසන්ධික පසුබැස්මක ප්‍රකාශනය පමනක් නොවේ, එය වනාහී දැනට ම ජාත්‍යන්තර දේශපාලනය අස්ථාවර කරන්නා වූ ප්‍රගාඪ පද්ධතිමය ව්‍යාධියකි." අපේ මෙම විශ්ලේෂනය සනාථ කරනු ලැබ ඇත. වර්ෂයකට අධික කාලයක් පැසවමින් පැවති සබ් ප්‍රයිම් (අවමුඛ උකස්) අර්බුදය, ධනේශ්වර පද්ධතියේ පැවැත්ම ම ප්‍රශ්නයට භාජන කරන්නා වූ ගෝලීය අර්බුදයක් බවට මහා පරිමානව ප්‍රසාරනය වී තිබේ.

3. ගතවූ අවුරුද්දේ වැඩි කාලයක් පුරාම ආන්ඩුවේ කථිකයෝ ද ධනේශ්වර විශ්ලේෂකයෝ ද සබ් ප්‍රයිම් (අවමුඛ උකස්කර) අර්බුදයේ බරපතල හිඟ පාලනය කර ගත හැකි යයි ද එය වඩාත් පෘථුල ආර්ථිකයට බලපානු නැතැයි ද අවධාරනය කර සිටියෝ ය. නිවාස බුබුල පුපුරා යාම සිදුවෙද්දී ම, එය නොතකා, ගෝලීය ආර්ථිකය වඩාත් මූලික මට්ටමක සෞඛ්‍ය සම්පන්නව පවත්නා බව ඔව්හු කියා සිටියා හ. එහෙත් සැප්තැම්බරයේ පුපුරා ගිය මහා මූල්‍ය ව්‍යසනය මධ්‍යයේ මෙම ආත්ම-වංචනික අභ්‍යාසය බිඳ වැටුනි. සති ගනනාවක් ම ඇමරිකානු සහ ලෝක මූල්‍ය පද්ධතිය පරිපූර්න බිඳ වැටීමක මුවවිට දෙදරුම් කමින් පැවතුනේ ය. එක්සත් ජනපදයේ ජාතික රූපවාහිනියෙන් කතා කල ජනාධිපතිවරයා "ඇමරිකානු මූල්‍ය පද්ධතියේ ප්‍රධාන අංශ වසා දැමීමේ අවදානමට මුහුන දී ඇතැයි" ද වහාම තමන් යෝජනා කරන පියවර ගනු නොලැබී

නම් "ඇමරිකාව මූල්‍ය ව්‍යසනයක හීතිකාවට ඇද වැටෙනු ඇතැ"යි ද අනතුරු හැඟවී ය. 1933 මාර්තුවේ, (මහා අවපාතයේ පාතාලයේ දී) එවකට සිටි ජනාධිපති ෆ්‍රැන්ක්ලින් රූස්වෙල්ට් බැංකු පද්ධතිය තාවකාලිකව වසාදැමිය යුතු යයි ප්‍රකාශ කලායින් පසු අන් කිසි ජනාධිපතිවරයෙක් හෝ මෙවන් ප්‍රකාශයක් කර නැත්තේ ය.

4. ලෙහ්මන් බ්‍රදර්ස් හා මෙරිල් ලින්ච් වැනි ඇමරිකානු ධනවාදයේ මහා සුරුවම් හදිසියේ ම එක් රැයෙන්, එක්කෝ මුලුමනින් ම දිය කර හරිනු ලැබූහ. නැතහොත් වෙනත් ආයතනයන් තුලට උකහා ගනු ලැබූහ. ගෝලීය මූල්‍ය පද්ධතියේ පැවැත්ම පිලිබඳ සාර්වත්‍රික අවිශ්වාසය මධ්‍යයේ නය වෙලඳපල ඇනහිටියේ ය. ලෝක ධනේශ්වර ආර්ථිකයේ පරිපූර්න බිඳ වැටීමක් වලක්වා ගන්නා ලද්දේ, ඇමරිකා එක්සත් ජනපදයේ ද ඒ සමග ම යුරෝපයේ ද බැංකු, ඩොලර් ට්‍රිලියන ගනන් වටිනා මූල්‍ය පද්ධතිය ඇප දී බේරා ගැනීමට බැංකු පද්ධතීන් තුලට රාජ්‍යය ඩොලර් බිලියන ගනන් එන්නත් කිරීම තුලින් තුන් මසක් පුරා නොනැවතී ක්‍රියාත්මක කරන ලද, හදිසි පියවරවලින් පසුව ද දිගින් දිගටම තත්වය භයංකර ලෙස අස්ථාවරව පවතී. අර්බුදය විසඳී නැති අතර එහි ඉතාම තියුනු අවධිය එලඹෙමින් පවතින්නේ දැන් ය යන්න ධනේශ්වර පන්තියේ අතිශයින්ම තීක්ෂන විශ්ලේෂකයන් විසින් වටහා ගනු ලැබ ඇත. *ෆයිනෑන්ෂල් ටයිම්ස්* පත්‍රයේ තීරු ලේඛක මාටින් වොල්ෆ් නව වසර පිලිගත්තේ පහත සඳහන් අනතුරු හැඟවීමෙනි: "2009 අප ඉදිරියේ ඇත. සමහර විට එය පරම්පරා ගනනාවකට ම ආර්ථිකයේ ඉරනම තීන්දු කරලන්නා වූ වර්ෂය විය හැකි ය. සමහරුන් අපේක්ෂා කරන්නේ මෙම දශකයේ මැද වර්ෂවල පැවති ගෝලීය වශයෙන් අසමබර ආර්ථික වර්ධනය යලිත් තහවුරු කර ගත හැකි යයි කියා ය. එය වැරදි ය. අප ඉදිරියේ ඇති ප්‍රශ්නය නම් ඒ වෙනුවට වෙන යොදාගත හැක්කේ කුමක්ද යන්නයි. තෝරා ගත යුතු විකල්ප වන්නේ මැනවින් සමතුලිත වූ ලෝක ආර්ථිකයක් ද නැතිනම් බිඳී විසිරී යාම ද යන දෙකින් එකකි. මේ තෝරා ගැනීම තව දුරටත් කල් තැබිය නොහැකි ය. එය මේ වර්ෂයේ දී කල යුතු ය."

5. දරන හරිමින් තිබෙන අර්බුදයේ ඓතිහාසික ස්වභාවය හඳුනා ගැනීමේ දී නම් වොල්ෆ් මුලුමනින් ම නිවැරදි ය. එහෙත්, විකල්පයන් ඉදිරිපත් කිරීමේ දී ඔහු මුලුමනින්ම වැරදි ය. (ධනේශ්වර පද්ධතිය බිඳී විසිරී යාම සහතිකෙන්ම සිදුවිය හැක්කක් වන අතර, "වඩා හොඳ සමතුලිත ලෝක ආර්ථිකය" (ඔවුන්ට) කවර කලෙක වත් ගොඩනගා ගත නොහැකි ය. ලෝක ආර්ථිකය යලිත් "සමතුලිත කිරීම" - එනම්, ධනේශ්වර පදනමක නව ලෝක ආර්ථික සමතුලනයක් පිහිටුවාලීම ඉටු කර ගත හැකි වන්නේ එකම ආකාරයකින් පමනි. එනම් නිෂ්පාදන බලවේගයන් දැවැන්ත ලෙස විනාශ කර දැමීම, ජාත්‍යන්තර කම්කරු පන්තියේ ජීවන තත්වයන් ව්‍යසනකාරී ලෙස පහතට ඇද දැමීම සහ එය සාක්ෂාත් කර ගැනීම සඳහා ලෝක ජනගහනයෙන් විශාල කොටසක් සමූලඝාතනය කිරීමයි.

එහෙයින්, ධනේශ්වරය විසින් කඩාපාත් කරනු ලබන මහා විනාශයට පවත්නා එකම සැබෑ විකල්පය වනාහී ගෝලීය ආර්ථිකය සමාජවාදී පදනමක ප්‍රතිසංවිධාන කිරීම යි. ධනවාදයේ අරාජකත්වය පලවාහැර ප්‍රජාතන්ත්‍රවාදී හා විද්‍යාත්මක සැලසුම් සම්පාදනයක් ස්ථාපනය කල යුතු ය. නිෂ්පාදන මාධ්‍යයන් පිලිබඳ පෞද්ගලික අයිතිය අවසන් කොට සමාජමය අයිතිය තහවුරු කල යුතු ය. ආර්ථික ජීවිතයේ අරමුන වූ මානව අවශ්‍යතා සන්තර්පනය කිරීම, දිලිඳුබව හා දුක් වේදනා අහෝසි කිරීම, සහ මානව වර්ගයාගේ සංස්කෘතික මට්ටම උසස් කිරීම ඉටු කල හැක්කේ සමාජ සන්තක කිරීම මගින් පමනි. දේශපාලනමය වශයෙන් ප්‍රතිගාමී වූ ද ආර්ථික වශයෙන් විනාශකාරී වූ ද - නිමක් නැති ප්‍රචන්ඩත්වයේ ද මහා මිනිස් ඝාතනවල ද උල්පත වූ - ජාතික රාජ්‍ය පද්ධතිය වෙනුවට සමාජවාදී ලෝක රාජ්‍ය සංයුක්තයක් පිහිටුවා ලිය යුතු ය. කම්කරු පන්තියේ විප්ලවවාදී අරගල මගින් අත් කර ගන්නා ලද ජාත්‍යන්තර සමාජවාදී ක්‍රියා මාර්ගය පමනක් ම ගෝලීය අර්බුදයට විසඳුම වන්නේ ය.

## සමාජවාදී විප්ලවයේ වෛෂයික පූර්වාවශ්‍යතාවෝ

6. විප්ලවවාදී අර්බුදයක වෛෂයික පූර්වාවශ්‍යතාවෝ ඉමහත් වේගයකින් මුහුකුරා යමින් පවතිත්. 1931 ලියූ "විප්ලවවාදී තත්වයක් යනු කුමක් ද" නම් ලිපියේ ලියොන් ට්‍රොට්ස්කි මෙසේ පැහැදිලි කලේ ය:

> "විප්ලවවාදී තත්වයක් සඳහා ආර්ථික හා දේශපාලන පූර්වාවශ්‍යතා තහවුරු වන්නේ පොදුවේ කතා කරන කල්හි රටේ නිෂ්පාදන බලවේග පිරිහෙමින් පවත්නා කල්හි ය; ධනේශ්වර රටක් ලෝක වෙලඳපල තුල දරන්නාවූ විශිෂ්ඨ ගුරුත්වය (සාපේක්ෂ බර) ක්‍රමානුකූලව අඩු කැරෙන කල්හි එසේ ම එම රටේ පන්තිවල ආදායම් පහත වැටෙන කල්හි, විරැකියාව හුදෙක් අනුසන්ධික උච්චාවචනයක විපාකයක් නොවී එන්න එන්නම උග්‍රවන්නා වූ ස්ථිරසාර සමාජ නපුරක් බවට පත්වන්නා වූ තත්වයක් තුල ය." (*Writings of Leon Trotsky 1930-31* ලියොන් ට්‍රොට්ස්කිගේ ලේඛන 1930-31 (නිව් යෝර්ක්: පාත් ෆයින්ඩර්, 1973) 352 පි.)

7. මේ සියලුම තත්වයෝ අද දින එක්සත් ජනපදයට අදාල වෙති. එක්සත් ජනපද ධනවාදයේ

දිග් ගැසුනු පරිහානිය, දශක ගනනාවක් තිස්සේ කම්කරු පන්තියේ ජීවන තත්වයන් හෙලා, ජාතික ආදායමින් එහි පංගුව ද සැලකිය යුතු පරිද්දෙන් පහත දමා ඇත. එය දැන් වඩාත් වේගවත් හා තියුනු ස්වභාවයක් අත් කර ගනිමින් පවතී. වඩාත් මෑත දී ලැබුනු ගනන් හිලව් අනුව එක්සත් ජනපද කුටුම්බයක ධනය හුදෙක් එක් තනි අවුරුද්දක් තුල දල වශයෙන් හතරෙන් පංගුවකින් පහත වැටී තිබේ. 2008 වර්ෂයේ දී රැකියා මිලියන 2.6ක් කැපී ගිය අතර මෙම ලේ ගැලීම දිගින් දිගට ම සිදුවෙමින් පවතී. කම්කරු පන්තියේ ජීවන තත්වයන් ට එල්ල වූ ආර්ථික කම්පන 2009 පුරාම, වඩාත් දුර දිග යන දේශපාලන විපාක සහිතව පැතිරී යනු ඇත. ට්‍රොට්ස්කි ලියූ පරිදි

> "සමාජයේ ආර්ථික වර්ධනය සීරුවෙන් සිදුවන ක්‍රියා දාමයකි. එහෙත් ආර්ථික කොන්දේසි සමූලිකව ම වෙනස් කරනු ලැබූ කල්හි, එතෙක් හෙමින් සිදුවූ මානසික ප්‍රතිචාරය, ඉක්මනින්ම පැන නැගිය හැකි ය. එවන් වෙනස්කම් පන්තීන්ගේ මානසිකත්වය කෙරේ ඉක්මනින් හෝ සෙමෙන්, එහෙත් අනිවාර්යයෙන් ම බලපෑ යුතු ය. විප්ලවීය තත්වයක් ඇතිවන්නේ එකල්හි ම පමනි." (එම. 353 පි.)

8. සත්තකින්ම එක්සත් ජනපදයේ ද (ජාත්‍යන්තරව ම ද ) කම්කරු පන්තියේ දේශපාලන විඥ්ඥානය තවමත් විප්ලවවාදී නොවේ. සමාජ විඥ්ඥානය සමාජ භවයට (පැවැත්මට) පිටුපසින් ලගී. එහෙත් වෛෂයික තත්වයේ පෙර නුවූවිරූ වෙනස්කම් මිලියන ගනන් වැඩ කරන ජනතාවගේ ජීවන තත්වයන් වෙනස් කර දමමින් සමාජ පන්තීන් අතර සම්බන්ධතාවය අතිශයින්ම තියුනු අන්දමින් මාරු කර දමමින් ජනතා විඥ්ඥානයේ රැඩිකලීකරනය උදෙසා කොන්දේසි නිර්මානය කරමින් තිබේ.

9. මෙම අර්බුදයට සාමකාමී හෝ "සමාජමය වශයෙන්-අපක්ෂපාතී" විසඳුමක් තිබිය නොහැකිය. මහා ආර්ථික පෙරලියට ඇමරිකානු පාලක පන්තිය දක්වන්නාවූ වේලාව පිරිමසාගැනීමේ ප්‍රතිචාර මගින් කිසිම දෙයක් විසඳීමට නොහැකි වනු ඇත. දැනට ම හදිසියට ගැටගසා ගත් විවිධ 'ඇප දී ගලවා ගැනීමේ' සැලසුම් සඳහා බිලියන සිය ගනන් නාස්ති කර දමා තිබේ. ජනාධිපති ඔබාමා පිලිබඳව කතා කරතොත්, ඔහු උත්සාහ කරන්නේ කරන්නට බැරි දෙයක් කිරීමට ය; එය වනාහී ධනවාදයේ පදනම්වලට අත නොතබන, මූල්‍ය ප්‍රභූවේ ආසක්තයන්ට බාධා නොකරන විසඳුමකි.

10. අන්තර් සම්බන්ධිත සන්තතී දෙකක් දරන හරිමින් තිබේ; පලමු වැන්න නම්, ලෝක ධනවාදයේ උග්‍රවන ගෝලීය ප්‍රතිසතිතා ජාත්‍යන්තර කම්කරු පන්තිය දරිද්‍රතාවයට ඇද දමමින්, මහා මර්දනය ද එන්න එන්නම උග්‍රවන්නාවූ යුද ගැටුම් මාලාවක් ද ඇති කර ලීමට තර්ජනය කිරීම ය. දෙ වැන්න නම්, මෙම තත්වයන්ට ප්‍රතිචාර වශයෙන් කම්කරු පන්තියේ සමාජ හා දේශපාලන සටන්කාමිත්වය පමනක් නොව විප්ලවවාදී විඥ්ඥානයේ නව ආකාරයන් ද වර්ධනය වීම ය. තීරනාත්මක ප්‍රශ්නය වන්නේ මෙම සන්තතීන්ගෙන් කවරක් ආධිපත්‍යය දිනාගන්නේ ද යන්නයි. 2009 වර්ෂය තුල දී, සමාජවාදී සමානතා පක්ෂය වර්ධනය වීමට යන්නේ මෙවන් සන්දර්භයක් තුල දී ය.

11. අර්බුදයට ප්‍රතිචාර වශයෙන් ධනේශ්වර පන්තිය විසින් ගනු ලැබ තිබෙන පියවර පෙන්නුම් කරන්නේ ධනවාදයේ ආර්ථික බංකොලොත්කම පමනක් නොවේ, එහි දෘෂ්ටිමය බංකොලොත් බව ද වේ. නැගෙනහිර යුරෝපයේ ස්ටැලින්වාදී තන්ත්‍රයන්ගේ බිඳ වැටීමෙන් හරියට අවුරුදු 20ක් ගත වී ඇත. එම සිද්ධීන්ගෙන් කෙටි කලකට පසු 1991 දී සෝවියට් සංගමය ද බිඳ වැටුනි. මෙම සිද්ධීන් පෙන්නුම් කරන්නේ අවසානයේ දී ධනේශ්වර අර්ථික ක්‍රමයේ විජයග්‍රහනය යයි ජාත්‍යන්තර පාලක පන්ති ද මාධ්‍යයන්හි හා විශ්වවිද්‍යාලවල උන්ගේ ගැත්තරයෝ ද ජය ඝෝෂා කලහ. ආර්ථික සම්පත්වල අන්තිම හා නොවරදින සුලු මෙහෙයුම්කරුවා ධනේශ්වර වෙලඳපල යයි ඔව්හු නිවේදනය කලෝ ය. ආර්ථික ජීවිතය තුලට රාජ්‍යයේ මැදිහත් වීම හෙලා දුටු ඔව්හු ඒ වනාහී මූල්‍ය සංස්ථාවල ද නිෂ්පාදන මාධ්‍යයන්ගේ ද හිමිකරුවා වන ධනපති පන්තියේ වරප්‍රසාදවලට කරනු ලබන විනාශකාරී ඇඟිලි ගැසීමක් යයි හෙලා දැක්කෝය. අපාලිත වෙලඳපල ද අසීමිත ව්‍යාපාරික නිදහස ද ඇමරිකා එක්සත් ජනපදයේ තරම් ඉමහත් භක්ති ප්‍රමෝදයකින් වෙන අන් කිසි තැනක වර්නනා කරනු ලැබුවේ නැත.

12. ධනේශ්වර මූල්‍ය පද්ධතියේ 2008 මහා බිඳවැටීම නිදහස් ව්‍යවසායේ පුරෝහිතයන්ගේ මුහුනුවල කුනු බිත්තර ගල්වා තිබේ. සකල ආර්ථික ප්‍රශ්නයකට ම හොඳම විසඳීම නම් ඒවා වෙලඳපලට ම බාර දීම යයි ද සියලු සමාජ සේවා විසඳුම් ජාතික අයවැයට හානියක් යයි ද ඕක්කාරකව හෙලා දුටු සෑම දේශපාලකයෙක් ම, ජාවාරම්කරුවෙක් ම, වෘත්තිමය අර්ථශාස්ත්‍රඥයෙක් ම, මාධ්‍ය වේදියෙක් ම දැන් කල දවස ගෙවන්නේ මහ බැංකු ඇද වැටෙනු බලබලා, එම දූෂිත අර්බුද-ග්‍රස්ත සංස්ථාවන්ට මුක්කු ගැසීම උදෙසා ආන්ඩුව යෝධ මූල්‍යමය පිදේනි දිය යුතු යයි ආයාචන කරමිනි. පුද්ගලික දේපලේ ද ආර්ථික පුද්ගලවාදයේ ද මෙම වන්දිභට්ටයෝ ඇමරිකාවේ ජනතාවගේ පොදු සම්පත් බැංකු අතට පවරා දීමට කිසිසේත් පසුබට නොවූහ. අනෙක් සෑම දෙනාටම උචිත වන්නේ ධනවාදය යැයි අවධාරනය කරන එක්සත් ජනපද ආන්ඩුව ධනපති පන්තියට නම් සමාජවාදයක් පිදේනි දී ඇත. ඇත්තටම මෙම ආන්ඩු අතගැසීම පෙන්නුම් කරපු සමාජවාදයක් නැත. ඒ සියල්ලේ ම ඉලක්කය වූයේ මූල්‍ය ප්‍රභූවේ

ඉතාම බලගතු කොටස්වල ආසක්තයන් තහවුරු කර ලීමයි. එහෙත් ආර්ථිකය තුලට කරන ලද මෙවන් යෝධ මැදිහත් වීම් ධනේශ්වර දෘෂ්ටිවාදයේ බුද්ධිමය යුක්ති යුක්ත භාවය ද කීර්තිය ද දෙදරවූ ප්‍රහාරයක් වූයේ ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමාජවාදයේ හා මාක්ස්වාදයේ පුනර්ජීවනයකට දොර හැරෙනු ඇත.

## එක්සත් ජනපද ධනවාදයේ දිග් ගැසුනු පරිහානිය

13. අර්බුදයේ මුල් දශක ගනනාවක් ඈතට දිවෙයි. අනාගතයේ දී ඒ පිලිබඳව 2008 ලියන ඉතිහාසඥයන් විසින් සහතිකෙන්ම අඩුවශයෙන් 1971 දී ඩොලර් හා රන් පරිවර්ත්‍යතාවය ඇතුලත් කර ගත් බ්‍රෙට්න් වුඩ්ස් පද්ධතියේ බිඳ වැටීම දක්වා වත්, සිද්ධීන්ගේ සම්බන්ධතාවය පිහිටුවනු ලබනු ඇත. දෙවන ලෝක යුද්ධයෙන් පැන නැගි ජාත්‍යන්තර පර්යාය පදනම් කරවූයේ එක්සත් ජනපදයට එකල්හි පැවති ඉහවහ යන ආර්ථික හා කාර්මික ආධිපත්‍යය මතය. 1945 ඇමරිකානු පිලිවෙතේ අවශ්‍ය අරමුනක් වූ යුරෝපීය හා ජපන් ධනවාදය ගොඩ ලා ගැනීම පරස්වාවකව සිදුකලේ බ්‍රෙට්න්වුඩ්ස් සම්මුතිය පවත්වාගෙන යා නොහැකි තත්වයක් උද්ගත කිරීමයි. නික් බීම්ස් සහෝදරයා මෑතක දී පෙන්නුම් කල පරිදි: "අවසාන විග්‍රහයේ දී බ්‍රෙට්න්වුඩ්ස් පද්ධතිය ගිලා බැස්සේ එය විසින් ම පැන නංවනු ලැබූ ලෝක වෙලඳමේ හා ලෝක ආයෝජනයේ ප්‍රසාරනයේ - ප්‍රාග්ධනයේ ලෝක පරිමාන ප්‍රසාරනය - ජාතික පරිපාලන පද්ධතියක් තුල රඳවා තබා ගත නොහැකි වූ නිසා ය. ලෝක ආර්ථිකය හා ජාතික රාජ්‍ය පද්ධතිය අතර ප්‍රතිසතිතාව යලිත් වරක් ඉස්මත්තට පැමින තිබුනි." (ලෝක ආර්ථික අර්බුදය: මාක්ස්වාදී විග්‍රහයක්)

14. 1971 පටන් දිගින් දිගටම පැවත ආ ප්‍රවනතාවය ඇමරිකා එක්සත් ජනපදයේ ගෝලීය ආර්ථික තත්වය පිරිහී යාම ය. මෙයට යටින් පවත්නේ ධනවාදයේ පොදු ආර්ථික අස්ථාවර භාවය යි. ආසියාවට ප්‍රාග්ධනය යෝධ වශයෙන් ගලා ඒම ද එම සුවිසල් මහාද්වීපය තුල කාර්මික නිෂ්පාදනයේ වර්ධනයේ විශ්මය ජනක වේගවත් වර්ධනය ද ලෝක ආර්ථික අසමතුලිතතාවය තව දුරටත් උග්‍ර කර ඇත. විශේෂයෙන් ම ගත වූ දශකය ගැඹුරුවන්නා වූ ප්‍රතිසතිතාවන් මාලාවක් විසින් විලක්ෂනය කරනු ලැබ ඇත. ඒවා නම් එක්සත් ජනපදයේ දැවැන්ත ගෙවුම් ශේෂ හා වෙලඳ හිඟය, ලෝකයේ පොදු විනිමය විනිමය මුදල ලෙස එක්සත් ජනපද ඩොලරයට පැවැති තැන අවදානම් වීම; ඇමරිකානු ආර්ථිකය මූල්‍යකෘත (නය මත පදනම්) ආර්ථිකයක් බවට පත් වී සැබෑ වටිනාකම් නිෂ්පාදනයෙන් වඩවඩාත් ඈත් වීම; යන කරුනු ය. සමපේක්ෂක බුබුලු මාලාවක් පැනනැගීම හා බැඳුනු - වෝල්වීදියේ දිලිසීම ගත වූ දශකය පුරා විටින් විට සිදු වූ පිපිරීම් ගනනාවක් වසන් කලේ ය: ඒවා නම් 1997 නැගෙනහිර ආසියානු මූල්‍ය අර්බුදය, ලෝංග් ටර්ම් කැපිටල් මැනේජ්මන්ට් සංස්ථාව හා රුසියානු 1998 දී රූබලය බිඳ වැටීම, 2001 දී ඩොට්කොම් (ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය) බුබුල බිඳ වැටීම හා එය පිටුපස එලඹි මහ සංගත කොම්පැනිවල දූෂන සෝලි පෙල යි.

15. එක් සංඛ්‍යා ලිඛිතයක් මෙම ප්‍රවනතා සාරාංශ කර දක්වයි. 1980 දී එක්සත් ජනපදයේ ලාභවලින් මූල්‍ය කර්මාන්ත අංශය විසින් ජනනය කරන ලද ලාභය සියයට 6 ක් පමනි; 2008 දී මෙම අනුපාතය සියයට 40ක් විය. පරිභෝගය විසින් නිෂ්පාදනය ඉක්මවනු ලැබූ සමාජයක නය රෝල් කිරීම ද මූල්‍යමය වංචා ද ආර්ථික ජීවිතයේ අත්තිවාරම බවට පත් විය.

## බිඳ වැටීමේ බලපෑම

16. මෙම ප්‍රතිසතිතාවන්ගේ තීරනාත්මක සට්ටනය කල් දමා ගැනීමට පාලක පන්තිය සමත් වීම මගින් ඉටු වූ එකම දෙය නම්, අන්තිමේ දී ඒවා - ගත වූ අවුරුදු එකහමාර තුල තීරනාත්මකව ඉස්මත්තට පැමිනි කල්හි - සට්ටනය වඩවඩාත් උත්සන්න වීම ය. 2008 ග්‍රීෂ්ම ඍතුවේ දී ආරම්භ වූ නය අර්බුදය සාරභූත වශයෙන් ම වටිනාකම්වලින් තොර වූ වත්කම්වලට බරපතලව බැඳී පැවති එක්සත් ජනපද මූල්‍ය පද්ධතිය වෙලා ගත්තේ ය. 2008 වර්ෂය තුල දී ප්‍රමුඛ මූල්‍ය ආයතන එකක් පිටුපස එකක් එක්කෝ බිඳ වැටුනේ ය, එසේ නැතිනම් රජය ඇප දී මුදා ගැනීමට සිදු විය. එක්සත් ජනපදයේ පස්වන විශාල ආයෝජන බැංකුව වන බෙයර් ස්ටියර්න්ස්, එක්සත් ජදපදයේ නව උගස්කරවලින් සියයට 80ක් කර දී සිටින ෆැනී මේ සහ ෆ්‍රෙඩී මැක්, ලෙහ්මන් බ්‍රදර්ස් සහ මෙරිල් ලින්ච් යන ආරක්ෂක බැංකු, ලෝකයේ විශාලතම රක්ෂන සමාගම වන වොෂින්ටන් මියුචුවල් මෙසේ අර්බුදයට පත් සංස්ථාවන් අතර ප්‍රධාන අතර, ඊට අමතර තවත් සමාගම් විශාල සංඛ්‍යාවක් බිඳ වැටුනි. ඇමරිකානු මූල්‍යකරන පද්ධතියේ සමස්ත භූ ලක්ෂන ම පදනමෙන් ම වෙනස් කරනු ලැබුනි. බැංකු පද්ධතිය බලවත් කැටි කිරීමකට ලක්ව තිබේ. කුඩා බැංකු බිඳ වැටෙමින් ද වඩා විශාල ඒවා විසින් ගිල ගනු ලබමින් ද නොනැවත සිදුවන්නාවූ මෙම ක්‍රියා දාමයට ආන්ඩුවේ සමීප ආධාරය ලැබේ. ඒ සමග ම ඇමරිකානු කාර්මික නිෂ්පාදනයේ - ජෙනරල් මෝටර්ස් හා ෆෝර්ඩ් සමාගම් ඇතුලු - පූජනීය නිකේතනයෝ බිඳ වැටීමේ මුවවිටේ වේලමින් පවතිත්.

17. 2008 අග වන විට, ලෝක වෙලඳපොලවල මස්මඩුව කොටස් වටිනාකමින් ට්‍රිලියන 30ක් වනසා දැම්මේ ය. සමපේක්ෂක බුබුල බිඳ වැටීම ඇරඹුනි. මහා නය කන්දරාව මත තම වැඩ කටයුතු පදනම් කර ගෙන තිබුනු බැංකු හා වෙනත් ආයතන "විරක්ෂන කිරීම" ආරම්භ කලේය. මූල්‍ය විනෝද සවාරිය

අවසානයකට පත් වෙත්ම, සමපේක්ෂන මත පදනම් වූ පිම්බීමට යටින් පැවති අපරාධකාරීත්වය එළිදරව් වී තිබේ. වොරන් බාෆට් (නමැති ප්‍රමුඛ මූල්‍ය ජාවාරම්කරු) වැනි ඇති තතු දන්නෙකුගේ වචනවලින් ම පැහැදිලි කලහොත් "හෙලුවෙන් පීනන එකා කවුදැයි සොයා ගත හැක්කේ දිය පහර බැස ගිය කල පමනි." ඇත්ත වශයෙන් මේ දැන් දියට බැස ගෙන සිටින්නේ එක් මුදල් ජාවාරම් කරුවෙකු නොවේ. බර්නී මැඩොෆ් නම් නස්ඩැක් කොටස් හුවමාරුවේ හිටපු සභාපති වරයා කරගෙන ගිය මගඩිය වනාහී මූල්‍ය බිඳවැටීම විසින් (මෙතෙක්) එළිදරව් කරනු ලැබූ ප්‍රෝඩාවලින් වඩාත්ම නම් දරාපු එකයි.

18. තමන්ගේ වැටුප්වල මූර්ත (සැබෑ) වටිනාකම පහත වැටෙන තතු තුල ආහාර, සෞඛ්‍යය සහ අධ්‍යාපනය වැනි මූලික අවශ්‍යතා සඳහා මුදල් සොයා ගැනීමට නිවාස උකස් නය මත පදනම් වූ මිලියන සංඛ්‍යාත ඇමරිකානු පවුල්වල ශුද්ධ ධනය එක්සත් ජනපද නිවාස මිල බිඳ වැටීම විසින් විනාශ භාග් කරනු ලැබ ඇත. එක්සත් ජනපදයේ නිවාස මිල එය නැගී සිටි ඉහලම මට්ටමෙන් දැන් පහත වැටී ඇති තරම මහා අවපාතය (19) සමයේ සටහන් වූ තරම මෙන් දෙගුනයක් වෙයි. ජේපී මෝර්ගන් සමාගමේ 2008 වාර්තාවක් මෙම විනාශය ඇමරිකානු ජනයාගේ ජීවන කොන්දේසි මත කොතරම් බලපෑමක් ඇති කලේ ද යන්න පිලිබඳ එක් ඇඟවීමක් කලේ යඃ "ඇමරිකානු කුටුම්බයන්හි ශේෂපත්‍රය මෑත දී දැවැන්ත ධන හානියකට පත් වී ඇත." එය තව දුරටත් මෙසේ පැවසීය. "කොටස් මිල ගනන්වල (401 (K) විශ්‍රාම ඉතුරු කිරීම්ද ඇතුලු) දැවැන්ත වැටීම ද ඒ හා එක්ව නිවාස මිල ගනන් නොනැවතී පහත වැටීම ද ගතවූ වර්ෂ තුල එක්රැස් කර ගැනුනු අති විශාල ධන සම්පත් සම්භාරයක් භංග කර දමා තිබේ. තුන්වන කාර්තුවේ දී පමනක් නිවාස ධන සම්පත් ඩොලර් ට්‍රිලියන 2.8කින් පහත වැටුනි. ඒ වනාහී සියයට 4.7ක ඇද වැටීමකි. ගතවූ වර්ෂයේ තුන්වන කාර්තුවේ දී ඉහලම මට්ටමට වර්ධනයව තිබුනු මට්ටම සිට මෙම සම්පත්වලින් සියයට 11.1ක් අතු ගෑවී විනාශ වී ගොසිනි."

19. "සැබෑ" ආර්ථිකය මත මූල්‍ය අර්බුදයේ බලපෑම දැනෙන්නට පටන් ගත්තා පමනි. දැනට ම පහත මට්ටමකට වැටී තිබෙන ඇමරිකා එක්සත් ජනපදයේ පාතාලය තව තවත් පහලට පතිත වෙමින් පවතී. ඇමරිකා එක්සත් ජනපදයේ ඉන්ස්ටිටියුට් ෆෝර් සප්ලයි මැනේජ්මන්ට් නම් ආයතනයේ දර්ශකය අනුව එක්සත් ජනපද කාර්මික නිෂ්පාදන දර්ශකය පසුගිය දෙසැම්බර් මාසයේ දී 32.4 කට පහත වැටුනිඃ ඒ වනාහී 1980න් පසු එය වැටුනු පහල ම මට්ටම වේ. 2008 අන්තිම කාර්තුවේ දී නිෂ්පාදිත භාන්ඩ ඇනැවුම්, කල් පවත්නා භාන්ඩ ඇනැවුම්, යන සියල්ල 2008 අග භාගය වන විට තියුනු ලෙස හීන වී ගියේ ය. රැකියා භංග වීම එන්න එන්නම උග්‍ර මට්ටම්වලට නගී. (2008 අවසාන මාස දෙකේ දී විනාශ කරන ලද රැකියා සංඛ්‍යාව මිලියනය ඉක්මවයි. මහ සංගත වැටුප් සහ සහන මහා පරිමානයෙන් කපා දැමීම ආරම්භ කර තිබේ. එක්සත් ජනපදයේ නිවාඩු සමයේ අලෙවි වූ භාන්ඩ ප්‍රමානය ශෝචනීය ලෙස පහල වැටී තිබේ. ඉන් පෙන්නුම් කලේ ඇමරිකානු ජනතාව මුහුන දී සිටින්නා වූ වැඩෙන ආර්ථික අවදානම යි.

20. මෙම බලපෑම දැනෙන්නේ හුදෙක් එක්සත් ජනපදයට පමනක් නොවේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල දැන් ප්‍රක්ෂේපනය කරන්නේ මීලඟ වර්ෂයේ දී ලෝක දල ජාතික නිෂ්පාදනයේ වැඩීම සිදුවනු සියයට 2ට අඩු ප්‍රමානයකින් ය කියා ය. මෙය වනාහී ලෝක ආර්ථික පසුබැස්මක (හායනයක) තීරක ලක්ෂ්‍යය ලෙස සලකන සියයට 3ක වර්ධන අනුපාතයට වඩා අඩු මට්ටමකි. තමන් ඔක්තෝබරයේ සැකසූ ලෝක ආර්ථික සංඛ්‍යා ලේඛන නොවැම්බරයේ දී යලිත් අලුත් කල ජාත්‍යන්තර මූල්‍ය අරමුදල 2009 සඳහා අපේක්ෂිත සියයට 0.5ක වර්ධනය සියයට 0.25ක සංකෝචනයක් දක්වා පහත දැමී ය. මෙය වනාහී දෙවන ලෝක යුද්ධයේ අවසානයෙන් පසු දියුනු ධනේශ්වර රටවල සිදිවූ ප්‍රථම වාර්ෂික සංකෝචනයයි.

21. යුරෝපය දැනටම ආර්ථික හායනයකට පාත්‍ර වී ගෙන තිබේ. පසුගිය මාසයේ දී අයිඑන්ජී බැංකුවේ යුරෝපීය ආර්ථිකඥ කැස්ටර්න් බ්‍රෙසෙස්කි කියා සිටියේ 2008 සතර වන කාර්තුව "ජර්මානු ආර්ථිකයේ කවර කලෙක වත් සිදු නොවූ බිඳ වැටීම ලෙස ඉතිහාස ගත වනු ඇතැයි" යනුවෙනි. යුරෝපා මහාද්වීපය පුරා ම ආර්ථික නිෂ්පාදනය තියුනු ලෙස වැටෙමින් පවතී. නැගෙනහිර යුරෝපය සහ යටගිය සෝවියට් කඳවුරේ රටවල් විශේෂයෙන්ම විනාශ භාග් වී ඇත. එය සිදුව ඇත්තේ එක්තරා දුරකට පසුගිය වසරේ අග භාගයේ මූලික භාන්ඩවල මිල වේගයෙන් බිඳ වැටීම හේතු කොට ගෙන ය. රුසියානු කොටස් දර්ශකය (ආර්ටීඑස්) 2008 දී සියයට 72 කින් වැටුනි. දැන් එරට මධ්‍යම ආන්ඩුව තම විදේශ විනිමය වේගයෙන් සිඳී යන තැනකට වැටෙමින් පවතී. ආසියාව සලකා බලන කල්හි, ලෝකයේ එක්සත් ජනපදයට ඉක්බිති දෙවන තැන ගන්නා ආර්ථිකය සහිත ජපානය ගතවූ වර්ෂයේ නොවැම්බර් මස සිට 2008 වර්ෂයේ නොවැම්බර් දක්වා කාලය තුල එහි ඉතිහාසයේ විශාලතම කාර්මික නිෂ්පාදන පරිහානියක් වූ සියයට 8ක වැටීමකට පාත්‍ර විය. එක්තරා දුරකට එයට හේතු වූයේ අපනයනවල සියයට 27ක වැටීමකි.

22. ආසියාවේ ලතින් ඇමරිකාවේ "වැඩෙමින් පවත්නා" ආර්ථිකයන් දියුනු ධනේශ්වර රටවල ආර්ථිකයන්ගෙන් වියුංජනය (ප්ලග්එක ගලවා වෙන් කිරීම) කල හැකිය යන න්‍යාය මුලුමනින්ම පුපුරා ගොස් ඇත. එක්සත් ජනපදයේ පාරිභෝගික වියදම පහත

වැටීම නිසා චීනයේ අපනයන වර්ධන වේගය දැඩි සේ පහත වැටී ඇත. චීන නිෂ්පාදකයෝ වහවහා කම්කරුවන් දොට්ට දමමින් සිටිති. එරට වර්ධන වේගය ශ්‍රම බලකායේ වේගවත් වැඩීම සමග කිසිසේත් ම නොසැසඳෙන තත්වයකට වැටී ඇතැයි ගනන් බලා ඇත. චීනයේ සමාජ පිපිරීමකට තත්වය මෝරා ඇත. කර්මාන්ත ශාලා වසා දැමීමට සමාජ සහන අහෝසියට එරෙහිව චීන කම්කරුවන්ගේ විරෝධය පලකෙරෙන බරපතල සමාජකවූ කලහ පිලිබඳ වාර්තා මෑත මාසවල දී දක්නට ලැබුනි. ලතින් ඇමරිකාවේ වියුංජනය පිලිබඳ මිථ්‍යාව බ්‍රසීල ජනාධිපති ලුයි ඉනාෂියෝ ලූලා දා සිල්වා දරන හරින අර්බුදය පිලිබඳව තමාගෙන් අසන ලද ප්‍රශ්නයකට පිලිතුරු දෙමින් මෙසේ ප්‍රකාශ කලේ ය. "ගිහින් බුෂ්ගෙන් අහන්න. අපරාධය කලේ ඔහු මිස මා නොවේ." එසේ කියා සති කිහිපයක් ගතවී යාමට පෙර බ්‍රසීල අගනුවර වූ සාඕ පාලෝ නුවර කොටස් වෙලඳපොල වන බොවෙස්පාවේ වටිනාකමෙන් සියයට 50ක් ම මකබෑවී ගියේ ය. ඇද වැටෙන ප්‍රාථමික නිෂ්පාදන මිල ද, සමපේක්ෂක ප්‍රාග්ධනය පලායාම ද විදේශ ඍජු ආයෝජන වියලී යාම ද ලෝක මූල්‍ය අර්බුදයේ බලපෑම පලල් කර තිබේ. එය විසින් වෙනිසියුලාවේ චාවේස්, බොලීවියාවේ මොරාලේස් සහ ඉක්වදෝරයේ කොරයා වැන්වුන්ගේ ඊනියා "වමට හැරීම" ට යටි වල කපා පන්ති අරගලයේ නව පුපුරා යාමක් සඳහා වේදිකාව සකසා තිබේ.

## පන්ති පාලනයේ අර්බුදය

23. 2008 සැප්තැම්බර් මාසයේ පටන් ඇමරිකානු පාලක පන්තිය විසින් පවත්වා ගෙන යනු ලබන පිලිවෙත් සමන්විත වී ඇත්තේ තත්කාර්යවාදී උපාමාරු වලිනි. බලවතුන් හා දේශපාලන සම්බන්ධකම් පවත්නා වූ උදවියට පෞද්ගලිකව ධනවත් වී ගැනීමට හැකි සෑම අවස්ථාවක් ම සලසා දෙන ගමන්, සමස්තයම බිඳ වැටීම වැලැක්වීමට එය උත්සාහ කර තිබේ. විනාශයට නියමිත සෑම පාලක පන්තියක ම විශේෂිත ලක්ෂනයක් වී ඇත්තේ සිය ආර්ථික ආසක්තයන් හා වරප්‍රසාද පසුපස නිර්දය ලෙස හඹා යාම මගින් සිදු කරනු ලබන්නේ සමාජමය වශයෙන් හේතුවත් පිලිවෙත් ක්‍රියාත්මක කිරීමට කිසි සේත් ම ඉඩ නැති තත්වයක් ජනිත කර ලීම ය. සිදු කෙරෙන සමාජ විනාශය නොතකා පුද්ගලික ධනය පස්සේ අතෘප්ති කර ලෙස දිවයාමේ දී ඇමරිකානු පාලක පන්තිය සමාන වන්නේ ද ඔප්පු කල හැකි පරිදි ඉක්මවා යන්නේ ද 1789 ප්‍රන්ස විප්ලවයට පෙරාතු සමයේ වංශාධිපති පෙලැන්තිය සමග ය. පාලක ප්‍රභුව නිර්ලජ්ජිතව කරගෙන යන්නා වූ භයංකර හා විකාර සහගත ධනය කඳු ගසා ගැනීම එන්න එන්නම වැඩි වැඩියෙන් මහජනයාගේ දේශපාලන රැඩිකලී කරනය ට හේතුවන්නා වූ බරපතල සාධකයක් බවට පත් වෙමින් පවතී.

24. එක්සත් ජනපද දේශපාලන සංස්ථාපිතයේ ප්‍රියතම ගුරුකමක් වූයේ ගැටලුවක් වෙත "මුදල් විසිකිරීමෙන්" එය විසඳිය නොහැකි බවය. බැංකු සහ මහ සංගතවලට දැවැන්ත මුදල් කුට්ටි පවරා දී මහජන සම්පත් දැවැන්ත ලෙස කොල්ලකෑමට ආර්ථික අර්බුදය පාවිච්චි කිරීමට නම් මෙම එම ආප්තය බාධාවක් වූයේ නැත. ටාර්ප් (ටීඒආර්පී) නමින් හඳුන්වන ලද ඇමරිකානු ආන්ඩුවේ 'අබල වත්කම් සහන' වැඩ පිලිවෙලේ කේන්ද්‍රීය පරමාර්ථය වූයේ එවන් ගසා කෑමකි. ඩිමොක්‍රටික් පක්ෂ එයට මුලුමනින්ම සහාය දුන්නේ ය. මේ වන විට එක්සත් ජනපද ආන්ඩුව මූල්‍ය පද්ධතියට මුක්කු ගැසීම සඳහා ඩොලර් ට්‍රිලියන 8 කට වැඩි ප්‍රමානයක් යට කොට ඇත. බැංකුවලට පොලී රහිතව මුදල් ලබා ගත හැකි වන පරිදි ආන්ඩුව පොලී අනුපාතික පහත දැම්මේ ය. 2008 අවසාන වන විට ඇමරිකානු මහ බැංකුව මුදල් අච්චු ගැසීම සඳහා යොදා ගත් ආන්ඩුව අවධමනයේ තර්ජනය වැලැක්වීම ද අරමුනු කොට ගෙන "ක්වොන්ටිටේටිව් ඊසිං" 'ප්‍රමාන සීමා ලිහිල් කිරීම' නම් පිලිවෙතක් ප්‍රකාශයට පත් කලේ ය.

25. සිය කොටස ඉටු කල බැරැක් ඔබාමා තමා ද ඩොලර් බිලියන 750 ක "උත්තේජන පැකේජයක්" ක්‍රියාත්මක කරන බව ප්‍රකාශ කර ඇත. මහ සංගතවලට ඩොලර් බිලියන 150ක් ලබා දුන් බදු ලාභයක් ද සාමාන්‍ය ජනයාට සොච්චම් බදු සහනයක් ද පුද්ගලික අංශයට යොමු වූ පොදු කාර්ය පිරි වැය වියදම් මාලාවක් ද එයට ඇතුල්වෙයි. අර්බුදයේ පරිමාව හා සලකන කල්හි මෙම පියවරයන් මුලුමනින් ම විසමානුපාතික වනවා පමනක් නොව ඒවා මෙම අර්බුදය නිර්මානය කලා වූ සමාජ බලවේගයන්ට මොනම ආකාරයෙන් වත් අභියෝග කරන්නේ ද නැත. ඒ සමග ම සමාජ ආරක්ෂනය සහ වෛද්‍ය පහසුකම් ඇතුලු සමාජ සහන වැඩපිලිවෙලට පහර දීමේ තම සැලසුම් ඔබාමා ප්‍රකාශ කර ඇත. කම්කරු පන්තියේ සමාජ තත්වයට එල්ල කරන ලද දරුනු පහරක් වන මෙම පිලිවෙතට ඩිමොක්‍රටික් හා රිපබ්ලිකානු පක්ෂ දෙකම සම්පූර්නයෙන් ම කැපවී සිටිති.

26. යෝජිත කිසිදු පියවරක් හෝ යටින් පවත්නා ගැටලුවලට කුමන ආකාරයකින් වත් අත ගසන්නේ නැත. ඒවා ක්‍රියාත්මක වන්නේ ප්‍රතිසතිතාවන් තව තවත් උග්‍ර කිරීමට ම පමනි. කිසිවෙක් හෝ පැහැදිලි කර නැති කරුන නම් ආන්ඩුව නිදැල්ලේ බැංකුවලට පිදේනි දෙන මුදල් ව්‍යාපාරවල ලාභදායීතාව ඉහල දමන්නේ කෙසේද යන කරුන ය. ඇමරිකන් ආන්ඩුව බැංකුවෙන් බැංකුවට ඇප දී ගොඩ දමන අතර එහි හිසට උඩින් එල්බෙන ප්‍රශ්නය නම් ඇමරිකානු ආන්ඩුව ඇප දී බේරා ගන්නේ කා විසින් ද යන්න යි. මෑත දී නිව් යෝර්ක් ටයිම්ස් ලිපියකින් පැහැදිලි වූ පරිදි චීන ආන්ඩුව දැනටමත් ඇමරිකානු භාන්ඩාගාර බිල්පත් මිලදී ගැනීම

සීමා කිරීම අරඹා ඇත. (මුදල් කන්දරා පවරා මහ ධනපතියන්) ඇප දී බේරා ගැනීමේ මෙම සැනකෙලිය විසින් අවසානයේ දී ඉස්මතු කරන්නේ යෝධ ඩොලර් අර්බුදයක් එලඹෙන්නට යන බවයි.

27. නොතකා හරිනු ලැබූ තවත් ප්‍රතිසතිතාවකි, එනම් ඇමරිකානු පාරිභෝගිකයාගේ විශ්වාසය යලි දිනා ගැනීම සඳහා, ලෝක ආර්ථික වර්ධනයට යටිරුකුල් සැපයූ පාරිභෝගික වියදම් "පිම්මේ ඉහල දැමිය යුතු ය"යි කැරෙන රෙකමදාරුවයි. එහෙත් මහ සංගතයන් ආර්ථික පාතාලයට ප්‍රතිචාර දක්වන්නේ වැටුප් කැපීමේ සහ කම්හල් වැසීමේ මහා පරිමාන වැඩ පිලිවෙලකිනි. කම්කරු පන්තියට විරුද්ධ මෙම මහා ප්‍රහාරයේ තියුනු හී තුඩ ලෙස පෙර ගමන් කරන්නේ එක්සත් ජනපද මෝටර් රථ කර්මාන්තයයි. ආන්ඩුව මෙම කර්මාන්තවලට දෙන නයෙහි අනිවාර්ය කොන්දේසිය විය යුතු වන්නේ ඔටෝ කම්කරුවන්ගේ රැකියා දස දහස් ගනනින් කැපීම ද ඔවුන් සියලුදෙනාගේ වැටුප් දරිද්‍රතා මට්ටමට ඇද දැමීම ද යන බව ඩිමොක්‍රටික් සහ රිපබ්ලිකන් පක්ෂ දෙකම තරයේ කියා සිටිති. ඔවුන් කියන්නේ කර්මාන්තයෙහි "පන රැක්ම" සඳහා එනම් ලාභදායී බව තහවුරු කිරීම සඳහා එවන් පියවර නැතුව ම බැරි බවයි. දැන් ඒවා මුලුමහත් ආර්ථිකය පුරාම ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම ක්‍රියාවලියෙහි ප්‍රතිඵලය වන්නේ එක්සත් ජනපදය තුල පාරිභෝගික වියදම් තවතවත් කප්පාදු කිරීම ද ආර්ථික පරිහානියේ විෂමචක්‍රයක් පිහිටුවා ලීම ද වේ. එමතු නොව ඇමරිකානු ආර්ථිකයේ අත්තිවාරම් පිලිසකර කිරීම සඳහා දැරෙන ඕනෑම ප්‍රයත්නයකට මුහුන දීමට සිදුවන කරුනක් නම් පාලක ප්‍රභූව ගත වූ අවුරුදු 30 පුරා නිෂ්පාදන බලවේගයන් ක්‍රමානුකූලව ගලවා ඉවත් කිරීමේ යෙදී සිට ඇති බවයි. මාර්ටින් වොල්ෆ් තවත් තීක්ෂන සැඳැහුමක් කලේය: "අමරිකා එක්සත් ජනපදය ද තවත් නයකාර රටවල් ගනනාවක් ද මේ වන විට දරන්නේ අලෙවි කල හැකි භාන්ඩ ද සේවාවන් ද නිෂ්පාදනය කිරීමේ ව්‍යුහාත්මක වශයෙන් නොපොහොනා ධාරිතාවකි." කෙලින් කිවහොත් එහි අර්ථය නම් මේ රටවල් චීනය වැනි අපනයනික රටවල් සමග ඔරොත්තු දෙන වෙලඳ තුලිතයක් පවත්වා ගැනීමට අසමත්ව සිටින බවය.

## ඇමරිකානු සහ ලෝක අධිරාජ්‍යවාදයේ උග්‍රවන ප්‍රතිසතිතාවෝ

28. ගෝලීය ආර්ථික අර්බුදය, ප්‍රමුඛ ධනේශ්වර බලවතුන්ගේ දේශපාලන අධිකාරයේ පදනමට යටින් හාරා දමා, පවත්නා අධිරාජ්‍යවාදී වූ දේශපාලන සම්බන්ධතා රාමුව බිඳ දැමීමට උදව් වනු ඇත. හිටපු ඇමරිකානු භාන්ඩාගාර උප ලේකම් රොජර් අල්ට්මන් ෆොරින් එෆෙයාර්ස් සඟරාවට ලියා ඇති ලිපියක මෙසේ සඳහන් වේ:

> "අවුරුදු 75කින් මොබ ඇති වූ නරකම බිඳ වැටීම වන 2008 මූල්‍ය ආර්ථික බිඳ වැටීම එක්සත් ජනපදයට හා යුරෝපයට ප්‍රධාන පෙලේ භූගෝල පරිමාන දේශපාලන පසුබෑස්මක් අත් කර දෙයි... ඉදිරි වසර තුල කුමන රටක් හෝ මෙම මූල්‍ය අර්බුදයෙන් ආර්ථික වාසි ලබනු නැත. එහෙත් රාජ්‍ය කිහිපයක් - වෙසෙසින් ම චීනය - වඩාත් සාපේක්ෂකව ශක්තිමත් ගෝලීය තත්වයක් ලබා ගනු ඇත. බටහිර රටවල් අසමත්ව පවතින තතු තුල වෙනත් රටවලට මූල්‍යමය වශයෙන් ආධාර කිරීමට ද ස්වාභාවික සම්පත් වැනි ක්ෂේත්‍රවල තීරනාත්මක ආයෝජන කිරීමට ද බෙයිජිනය ඉඩ සලසා ගනු ඇත."

29. ඇමරිකානු ධනේශ්වර පන්තියේ සාමූහික ඔලුගෙඩිය තුල කරනම් ගැසූ "ඒක ධ්‍රැවීය මොහොත" (ඇමරිකාව තනි සුපිරි බලවතා ලෙස ඉස්මතුවීම) පිලිබඳ ඉච්ඡාව හුදෙක් ආශ්චර්යජනක සිහිනයක් බව දැන් එලිදරව්වෙමින් පවතී. පාලක සංස්ථාපිතයේ සැලකිය යුතු කොටස් විසින් මෙම කරුන වටහා ගනු ලබමින් පවතී. යූඑස් නැෂනල් ඉන්ටලිජන්ස් කවුන්සිල් (ජාතික ඔත්තු සේවා මන්ඩලය) එහි 2008 නොවැම්බර් වාර්තාව වූ 2025 ගෝලීය ප්‍රවනතා (2025 ග්ලෝබල් ට්‍රෙන්ඩ්ස්) මන්ඩලය මෙසේ සඳහන් කලේ ය: "දෙවැනි ලෝක යුද්ධයෙන් පසුව නිර්මානය කරන ජාත්‍යන්තර පද්ධතිය දැන් නව බලවතුන් හා ගෝලීකෘත ආරථිකයක් ඉස්මතු වීම ද බටහිර සිට නැගෙනහිරට සාපේක්ෂකව ආර්ථික බලය ඓතිහාසිකව මාරුවීයාම ද රාජ්‍යනොවන ක්‍රියාකාරීන්ගේ බලපෑම් වඩවඩාත් පුලුල්වීම ද නිසා හඳුනා ගත නොහැකි පරිද්දෙන් වෙනස් වී යනු ඇත."

30. ඇමරිකා එක්සත් ජනපදයේ තත්වය පිරිහෙමින් ආර්ථික අර්බුදය උග්‍රවන තතු තුල මෙම පිරිහීම වලක්වාගැනීම සඳහා යුද්ධමය බලය යොදා ගැනීමේ උත්සාහය තවතවත් උග්‍ර වනු ඇත. ඇමරිකානු පාලක පන්තිය තමන්ගේ භූ-දේශපාලන ආධිපත්‍යය නැතිවී යාමක් සාමකාමීව පිලිගැනීමට සූදානම්වනු නැත. මෙම ශතවර්ෂයේ ප්‍රථම දශකය දැනටම පෙන්නුම් කර ඇති පරිදි එක්සත් ජනපදය, ලෝකයේ තීරනාත්මක භූ මූලෝපායික ප්‍රදේශ තුල තම බලය තහවුරු කර ගැනීම අරමුනු කොට ඉරාකය හා ඇෆ්ඝනිස්ථානය තුල තම නව විජිතකාරක මෙහෙයුම් දැනට ම ක්‍රියාවට දමා තිබේ. නැගෙනහිර යුරෝපයේ ද පෙරකල සෝවියට් රටවල ද තම බලපෑම පුලුල් කර ගැනීමට එක්සත් ජනපද අධිරාජ්‍යවාදය වැඩ අරඹා ඇත. මෙය පසුගිය අගෝස්තුවේ දකුනු ඔසෙටියාවට එරෙහිව ඇමරිකානු ආධාර ලත් ජෝර්ජියානු පාලකයන් දියත් කල ප්‍රහාරයෙන් පෙන්නුම් කල පරිදි රුසියාව සමග සෘජු ගැටුමක අද්දරටම පැමිනියේ ය. ඇමරිකානු ධනපති

පන්තිය මධ්‍යම ආසියාවේ අප්‍රිකාවේ හා ලතින් ඇමරිකාවේ චීන මහාපේක්ෂා දෙස ඉරිසියා ඇසින් බලා සිටී; චීන ප්‍රාග්ධනය ගලා ඒම මත තමන්ගේ රැ දී පැවැත්ම ගැන එක්සත් ජනපද ධනපති පන්තිය ගැඹුරෙන්ම දැනුවත්ව දැඩි අසහනයකින් යුතුව සිටී.

31. ඇමරිකානු අධිරාජ්‍යවාදයේ පුපුරා යාම වනාහී ගෝලීය කරනය ද ජාතික රාජ්‍ය පද්ධතිය ද අතර ප්‍රතිසතිතාවයේ අතිශයින්ම සංකේන්ද්‍රිත ප්‍රකාශනයයි. වෙලඳමේ සහ මූල්‍යකරනයේ මිලියන ගනන් හුයපටවලින් ලෝක ආර්ථිකය ඒකාග්‍ර වී පැවතුනේ වී නමුදු, එකිනෙකා සමග කාකොටාගන්නා විවිධ ධනේශ්වර කන්ඩායම්වල නියෝජිතයන් වූ රාජ්‍යයන් විසින් භූගෝලය කැබලි කරනු ලැබ ඇත. දැන් එක් එක් රාජ්‍යය තමතමන්ගේ ධනේශවර පන්තියේ ආසක්තතාවන් රැක ගැනීම සඳහා මැදිහත් වෙමින් පවතී. යුරෝපීය විශ්ලේශකයා ජර්මනිය "අසල්වැසියන් නට්ටම් කිරීමේ (බෙගර් දයි නේබර්)" පිලිවෙතක් අනුගමනය කරන්නේ යයි හෙලා දකියි. ඕනෑම ආර්ථික උත්තේජක පැකේජයකට "බයි ඇමරිකා (ඇමරිකන් බඩු මිලදී ගනු)" පිලිවෙතක් එකතු කල යුතු යයි ඇමරිකානු කර්මාන්ත හිමියෝ කියා සිටිති. 2008 සැප්තැම්බර්-ඔක්තෝබර් ආර්ථික ලෝ දිය ගැලීමෙන් පසු පවත්වන ලද විවිධ රැස්වීම්වල දී ලෝක ආර්ථික අර්බුදය විසඳ ලීමට සංකේන්ද්‍රිත මූලෝපායක් ඉදිරිපත් කිරීමට ප්‍රමුඛ ලෝක බලවත්තු අසමත් වූහ. ජාතික ආත්මලෝභිත්වය හා අන්‍යොන්‍ය ජාත්‍යන්තර ආයත්තතාව යන මේ දෙක එක්ව පිහිටීම තුලින් මතුවන්නා වූ සට්ටනයට ධනේශ්වර ක්‍රමය තුල පවතින්නා වූ එකම විසඳුම වන්නේ යුද්ධයයි. ඒ සමග ම මෙසේ උග්‍රවන්නා වූ සට්ටනයන් ම සමස්ත අස්ථාවරත්වය උග්‍ර කරමින් ලෝක ආර්ථිකය මත ආපසු බලපායි.

32. මෙමගින් ලෝක ජනතාව කෙරේ ඇතිකරන්නා වූ බලපෑම අතිශය විනාශකාරී වන්නේ ය. පලස්තීන ජනතාව මත ඊස්රායල් රාජ්‍යයේ විෂසෝර ප්‍රහාරය සියෝන්වාදී ව්‍යාපෘතියේ ප්‍රතිගාමී ස්වභාවය පිලිබඳ එලිදරව්වක් පමනක් නොවේ, ජාත්‍යන්තර කම්කරු පන්තිය ට ද සියලු පීඩිත ජනතාවට ද අනතුරු හැඟවීමක් ද වේ. ජාත්‍යන්තර නීතිය බිඳ වැටීම විදේශ පිලිවෙත්වල මුලුමනින්ම අපරාධකාරී භාවය සහ සිවිල් ජනතාවන්ට එරෙහි නිරන්තර මුර්ග ක්‍රියා දේශපාලන ජීවිතයේ කේන්ද්‍රීය ලක්ෂනයක් බවට පත්ව ඇත. ඇමරිකා එක්සත් ජනපදය ඉරාකයේ ෆලූජා ප්‍රදේශයේ දී ද ඊස්රායලයේ ගාසා තීරයේ ද පවත්වා ගෙන යන්නා වූ වර්ගයේ "ක්‍රියාන්විතයන්" අත ලඟ ඇති කාල පරිච්ඡෙදයේ දී වඩවඩාත් පොදු සහ සාමාන්‍ය දේවල් බවට පත්වනු නියත බව යුද කටයුතු සඟරාවල විශේෂඥයෝ අවධාරනයෙන් පෙන්වා දෙති.

## ඔබාමා පාලනාධිකාරය

33. බැරැක් ඔබාමාගේ නිල දිවිරුම් දීම සිදුවන්නේ උග්‍ර සමාජ හා දේශපාලන අතෘප්තියක පසුබිම තුල ය. ආර්ථික අර්බුදය පමනක් නොව දැනට ම පවත්නා යුද්ධයට එරෙහි ගැඹුරු විරුද්ධත්වය ද ඇමරිකානු ජනාධිපතිවරනයේ ප්‍රතිඵල පිලිබඳව මුඛ්‍ය භූමිකාවක් ඉටු කලේ ය. ගැඹුරුවන්නා වූ ආර්ථික භායනයක (පසුබැස්මක) කොන්දේසි යටතේ මිලියන ගනන් වැඩ කරන ජනයා නොවැම්බර් 4 ජනාධිපති වරනය සඳහා ඡන්ද පොලට ගියේ ඉරාකයේ සහ ඇෆ්ඝනිස්ථානයේ යුද්ධයන් අවසානයකට ගෙන ඒම ද වධ බන්ධන පැමිනවීම සහ ප්‍රජාතන්ත්‍ර අයිතීන් විනාශ කිරීම වැලැක්වීම ද ධනවත් මහ සංගත ප්‍රභූවට මුලුමනින්ම වාසි ගෙන දෙන ආර්ථික පිලිවෙත වලක්වා ලීම ද සඳහා තම ඡන්දය පාවිච්චි කිරීමේ අටියෙනි. මහජන විරෝධයට ලක් වූ සියලු ම පිලිවෙත් ක්‍රියාත්මක කිරීම පහසු කිරීම සඳහා තීරක භූමිකාවක් ඩිමොක්‍රටික් පක්ෂය විසින් ඉටු කරන ලද අතර ඇමරිකාවේ ද්විපක්ෂ ක්‍රමයේ සුවිශේෂ ස්වභාවය විසින් ඇතිකරන ලද බලපෑම යටතේ ජන සමාජය තුල පැසවූ විරෝධය ඩිමොක්‍රටික් අපේෂකයා තෝරා පත් කර ගැනීමේ ස්වරූපය ගත්තේය.

34. එහෙත් පාලක ප්‍රභූවේ දෘෂ්ටි ආස්ථානයෙන් ගතහොත් ඔබාමා දේශපාලන බලයට පත්වීම ඉටු කලේ මුලුමනින්ම වෙනස් කර්තව්‍යයකි. දේශපාලන සහ විදේශ පිලිවෙත් ක්‍රියාත්මක කරන සංස්ථාපිතයේ සැලකිය යුතු කොටසක් ඔබාමා පත් කර ගැනීම උපාමාරුවකට අවස්ථාවක් ලෙස දුටහ. ඔවුන් බුෂ් පරිපාලනයේ විදෙස් පිලිවෙත දුටුවේ ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ආසක්තයන්ට ව්‍යසනකාරී ප්‍රතිඵල අත්පත් කර දුන් පිලිවෙතක් හැටියට ය. දැන් එක්තරා සියුම් අලුත් උපාමාරුවක් උවමනා විය. ප්‍රථම අප්‍රිකානු ඇමරිකානු ජනාධිපතිවරයා ලෙස ඔබාමාට පැවති විභව තත්වය යොදාගෙන - ජනමාධ්‍යයන්ගේ ද මැනැවින් සැකැසුනු අලෙවි ව්‍යාපාරයක ද ආධාරයෙන් - ඇමරිකානු පිලිවෙතේ අත්තිවාරමට මොනම ආකාරයක අභියෝගයක් නොකොට ඔබාමා "වෙනසක්" නියෝජනය කරන්නෙක් ලෙස පිලිගන්වගත හැකි යයි දක්නා ලදී.

35. මැතිවරන ව්‍යායාමය පුරා සමාජවාදී සමානතා පක්ෂය අනතුරු හඟවා සිටියේ ඔබාමාගෙන් ද ඩිමොක්‍රටික් පක්ෂයෙන් ද බුෂ් පාලනාධිකාරයට එරෙහි සැබෑ විකල්පයක් ලැබේය යන මිථ්‍යාව අනතුරුදායක බවය. අප පක්ෂය අපගේ ම අපේක්ෂකයන් ද සහිතව මැතිවරනයට ඉදිරිපත් වූයේ ස්වාධීන සමාජවාදී ඉදිරිදර්ශනයක් ඉදිරිපත් කිරීම සඳහා ය. ඔබමාට ඡන්දය දිය යුතු යයි කියා සිටියා වූ ද පලල් මහජන විරෝධය මගින් කෙසේ හෝ ඔහු වමට තල්ලු කර ගත හැකියයි

යන මිථ්‍යාව වගා කලා වූ ද සියලු ම ප්‍රවනතාවන්ට සමාජවාදී සමානතා පක්ෂය තරයේ විරුද්ධ විය.

36. මැතිවරනයට සතියකට පසු ලෝක සමාජවාදී වෙබ් අඩවිය ආර්ථික අර්බුදය කම්කරු පන්තිය තුල සමාජමය විරුද්ධත්වයක් අවුලුවාලමින් නව පාලනයට එරෙහි ගැටුමක් නිර්මානය කරනු ඇතැයි පැහැදිලි කලේ යඃ

> කම්කරු පන්තිය තම සමාජමය අවශ්‍යතාවයන් සඳහා සටන් කිරීම අරඹා ඔබාමා පාලනාධිකාරය සමග ගැටුමට එළඹී ඔබාමා පාලනාධිකාරයේ පන්ති ස්වභාවය එළිදරව්වන පරිදි, කම්කරුවන් එයට විරුද්ධව ඉදිරියට එන කල්හි සිදුවන්නට යන්නේ කුමක් ද? එවිට ධනේශ්වරයේ සහ සුලුධනේශ්වරයේ එක් කොටසකගේ දේශපාලන ආස්ථානයක් ලෙස ලිබරල්වාදයේ පන්ති පදනම සහ අති මූලික ප්‍රතිගාමී ස්වභාවය එළිදරව් වනු ඇත.
>
> ඔබාමාගේ ජයග්‍රහනය ගැන මුලදී කොතරම් උද්දාමයක් පැවතුනා ද යත්, ගැඹුරුවන්නා වූ ආර්ථික අර්බුදය ඉක්මනින්ම හෝ කල් පසුවී දශලක්ෂ සංඛ්‍යාත ඇමරිකානුවන්ගේ ජීවිත තුලට දැනෙන ලෙස කා වදිනු ඇත. එමගින් නව පාලනාධිකාරයට පදනම සපයන්නා වූ පන්ති ආසක්තයන් මොනවාදැයි එළිදරව් කිරීම ඇරඹෙනු ඇත. මෙය ඇමරිකා එක්සත් ජනපදය තුල පන්ති අරගලයන්හි නව අධියරකට කරලිය සකසනු ඇත ("ඔබාමා තෝරා ගැනීමෙන් සතියකට පසු").

37. මෙම විශ්ලේෂනය වේගයෙන් සනාථ වී තිබේ "නිදහස් ලෝකයේ නායකයා ලෙස" තම නව පදවියේ වැඩ භාරගැනීමට පෙරාතුව ම ඔබාමා තම කැබිනට් මන්ඩලයට කල පත්වීම්වල දී ද, ඔහුගේ යෝජිත පොදියේ, "උත්තේජන"ද ගාසා තීරයට ඊශ්‍රායලය පහර දීම තුල ද පෙන්නුම් කර ඇත්තේ තමා මහා ආර්ථික සංගතවල ප්‍රභූවේ බලගතුම කන්ඩායම්වලට තම පක්ෂපාතීත්වය ය. උපායන් සහ කාලයේ මෙන වෙනස්කම් ඇති කල ද ඇමරිකානු යුද යන්ත්‍රය ගලවා දැමීමක් නම් සිදු නොවනු ඇත. ඇමරිකානු අධිරාජ්‍යවාදයේ භූගෝලීය මහාශාවන් අතහැර දැමීමක් ගැන කියනුම කවරේ ද? ඉරාකයේ ආක්‍රමනය උග්‍ර කිරීම (සර්ජ්) පිලිවෙතේ නිර්මාපකයා වූ ද බුෂ්ගේ ආරක්ෂක ලේකම් වූ ද රොබට් ගේට්ස් ඔබාමා විසින් තම කැබිනට් මන්ඩලය තුල ද රඳවා ගන්නා ලදී. නව පාලනාධිකාරයේ විදේශ පිලිවෙතේ ගමන් මග ගේට්ස් ෆොරීන් එෆෙයාර්ස් සඟරාවේ ඉතාම මෑත කලාපයේ මෙසේ විස්තර කලේ යඃ ඇෆ්ඝනිස්ථානයේ යුද්ධය ඉදිරියට පවත්වාගෙන යාම තම සතුරන් බවට පත්විය හැකි බලවතුන්ට - චීනය සහ රුසියාව ද ඇතුලුව - එරෙහිව ඇමරිකා එක්සත් ජනපදයේ සම්ප්‍රදායික යුදමය ආධිපත්‍යය දිගින් දිගට ම පවත්වා ගෙන යාම සහ තව තවත් ආක්‍රමනයන් ද සන්නද්ධ නැගිටීම්වලට එරෙහි (කවුන්ටර් ඉන්ස'ජන්සි) මෙහෙයුම් සැකසීම. භාන්ඩාගාර ලේකම් ලෙස ඔබාමා විසින් පත් කරනු ලැබ ඇති තිමොති ගයිට්නර් වනාහී පෝල්සන් හා බර්නාන්කේ යන දෙදෙනාට එකතුව වෝල්වීදියේ මහා සමාගම් ඇප දී බේරාගැනීමේ ප්‍රධාන කෙරුම්කාරයෙකි. මහ බැංකුවලට විශාල මුදල් පොදි ලබා දෙමින් බුෂ් පාලනාධිකාරයේ පිලිවෙත තමාද ඉදිරියට ගෙන යන බව ඔබාමා පැහැදිලි කර තිබේ. තමාට ඡන්දය දුන්නවුන්ගේ අපේක්ෂා ඔබාමා විසින් හෙලා දකිනු ලැබ ඇත්තේ අතිශයින් ම ප්‍රකෝපකාරී ස්වභාවයකිනි. තමන්ට ඡන්දය දුන් දශ ලක්ෂ සංඛ්‍යාත ජනතාවකගේ දේශපාලන හා සදාචාරාත්මක චේතනාවන්ට තමා ගේ කිසි තැකීමක් ඇත්තේ නැති බව ඔබාමා සෑම විටම විදහා දක්වයි. මෑතක දී පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවක දී චේනි තමාට දුන් "මහා අවවාදය" ගැන ඔබාමා ස්තුති කලේය. මෙම අවවාදය නම් ඔබාමාගේ ම වචනවලින් කිවහොත් "නව ජනාධිපතිවරයා අසම්පූර්න තොරතුරු හෝ තමන් කලින් කල මැතිවරන ප්‍රචාරක කථා මත පදනම් ව තීන්දු නොදිය යුතු බව ය." මේ කියන්නේ නව ජනාධිපති තමා තේරීපත්කිරීමේ දී ඇමරිකානු ජනතාවට දුන් පොරොන්දු මත පදනම් වියයුතු නැති බවය. තමා බුෂ් පාලනාධිකාරයේ නීති විරෝධී ක්‍රියා වධදීම් ද ඇතුලුව පරීක්ෂාවට භාජන කරන්නේ නැති බව ඔබාමා ප්‍රකාශ කලේ මෙසේයඃ "අප පසුපස බැලිය යුතු නැත, ඉදිරිය බැලීම අවශ්‍යය."

38. ඔබාමා තමාගේ ම මැතිවරන පොරොන්දු මෙතරම් හතිහලන වේගයකින් අතහැර දැමීම පෙන්නුම් කරන්නේ ඔහුගේ ම වංචනික භාවය සහ නරුම භාවය පමනක් නොවේ එය ඇමරිකානු ප්‍රජාතන්ත්‍රවාදයේ ගැඹුරු අර්බුදයක් පිලිබිඹු කරයි. පවත්නා සංස්ථාවන් ද දේශපාලන රාමුව ද මහජනතාවගේ මතය ප්‍රජාතන්ත්‍රවාදීව ප්‍රකාශනය කිරීමට කිසිදු ඉඩක් තබන්නේ නැත. බලයේ සිටින්නේ ඩිමොක්‍රටික් පාක්ෂිකයෙකුවුව ද නැතහොත් රිපබ්ලිකන් පාක්ෂිකයෙකුවුව ද ආන්ඩුවේ පිලිවෙතේ මූලික දිශාව වනු ඇත්තේ එකකි. "ද්විපක්ෂ ක්‍රමය" වඩවඩාත් නිර්ලජ්ජිත ලෙස එළිපිට ක්‍රියාත්මක වන්නේ බලධාරී මූල්‍යමය කතිපයාධිකාරය සිය බලය ක්‍රියාත්මක කරන්නා වූ ද රාජ්‍ය පාලනය කරන්නා වූ ද උපකරනය හැටියට ය. සාරභූතව තහවුරු වී ඇති දේශපාලන කාරනාව නම් නිමක් නැති වාම ලිබරල් සුලුධනේශ්වර විරෝධතා සංවිධානයන් විසින් කියාපානු ලබන ඔබාමා පාලනාධිකාරය "වමෙන්" මහජන පීඩනයක් මගින් වෙනස් කල හැකි ය යන අදහස කිසිසේත් ම ක්‍රියාත්මක කල හැක්කක් නොවන බවය.

39. ඔබාමා තෝරා පත් කර ගැනීමේ කිසියම් යහපත් ප්‍රතිඵලයක් වී නම් එය වනාහි ඩිමොක්‍රටික් පක්ෂය ද එම පක්ෂය විසින් පන්ති අරගලය සහ ධනේශ්වර සමාජයේ සූරාකෑම් ස්වභාවය සහ පීඩනය කෙරෙන් අවධානය ඉවතට යොමු කිරීමේ මගක් ලෙස ''අනන්‍යතා දේශපාලනය'' යොදාගැනීම අපකීර්තියට පත් කිරීමයි. කම්කරු පන්තියේ එක්සත් භාවය ඉල්ලා සිටින්නා වූ සමාජ සමානතාවය සඳහා අරගලය වෙනුවට ඔවුහු විවිධ සුලු කන්ඩායම් හෝ පීඩිත කොටස්වල කුඩා කන්ඩායම්වලට සමාජ වරප්‍රසාද ප්‍රධානය කිරීම යොදාගන්නා ලදී. දශක ගනනාවක් ගතවන තෙක් විවිධ සුලුධනේශ්වර කන්ඩායම්වල ආධාරය ලත් ඇමරිකානු ලිබරල්වාදයේ ගුනදෙස්සෝ වර්ගය, ස්ත්‍රී පුරුෂභාවය හා ලිංගික යොමුව ඇමරිකානු සමාජයේ සාරභූත ප්‍රවර්ගයන් යයි හුවා දක්වමින් පන්ති භේදයේ අර්ථභාරය දැනුවත්ව අකාමකා දැමීමට උත්සාහ කලහ. මෙම අනන්‍යතා දේශපාලනයේ ගැලීගැනීම ඩිමොක්‍රටික් පක්ෂයේ තියුනු දකුනට පැදීමත් සමග සම්පාතව ඇත. කෙසේ වෙතත් (සුලුකන්ඩායම්වල වරප්‍රසාදිතයින්ට) බලය පවරාදීමේ ක්‍රියා සහ වෙනත් පිලිවෙත් සෑම විටම සම්බන්ධව ඇත්තේ වඩවඩාත් ගැඹුරුවන්නාවූ සමාජ අසමානතාවය සමග ය. කලු ජනගහනය අතර සමාජ අසමානතාවය වැඩීම ද මෙයට ඇතුලත් ය. ඔබාමා තෝරා පත් කර ගැනීමත් සමග වාර්ගික දේශපාලනය උරගා බැලෙනු ඇත. ඇමරිකා එක්සත් ජනපදයේ ද අන් සෑම රටකම තීරනාත්මක සමාජ ප්‍රවර්ගය වන්නේ පන්ති භේදය යි. පන්ති අරගලය පුපුරා යන කල්හි එය කල් ගත නොවී වඩවඩාත් වේගයෙන් නව ඔබාමා පාලනයට එරෙහිව යොමු වනු ඇත.

## සමාජවාදය සහ කම්කරු පන්තිය

40. සෑම ඓතිහාසික අර්බුදයක් ම ප්‍රධාන පන්තීන්ට බල කර සිටින්නේ ස්වාධීන පන්ති ආස්ථානයක් දරමින් අඩු හෝ වැඩි පැහැදිලිකමකින් යුතුව සිය පන්ති විසඳීම ඉදිරිපත් කරන්නට ය. ජාතික සමගිය සහ පොදු කැප කිරීම කරන ලෙස මුලින් කෙරෙන ඉල්ලීම වේගයෙන් අන්‍යොන්‍ය හෙලාදැකීම් කරා ද උග්‍රවන්නා වූ සතුරුබව කරා ද විවෘත සට්ටනය කරා ද අන්තිමේ දී දියවී යනු ඇත. මෙම සන්තතිය දිගහැරෙනු ඇති නිශ්චිත කාල සටහන කුමක් දැයි සටහන් කර ඉදිරිපත් කිරීම කල නොහැක්කකි. 1929 බිඳවැටීමට ප්‍රතිචාර වශයෙන් කම්කරු පන්තියේ ව්‍යාපාරයත් ඉදිරියට ඒමට අවුරුදු ගනනාවක් ගත විය. එහෙත් එම ව්‍යාපාරය එලඹියේ ය. (ඇමරිකාවේ නම්) ප්‍රථමයෙන් විරැකියා සහන ඉල්ලා 1932 දී ඇති වූ බුවර්නස් පෙලපාලිවල ආකාරයට ය. ඉක්බිති 1934 දී මිනියපොලිස් කොලැඩෝ සහ සැන්ෆ්‍රැන්සිස්කෝවේ සිදු වූ කරලිකාරී වැඩවර්ජන රැල්ල ලෙස ය. ඉක්බිති 1935 දී සීඅයිඕ සංවිධානය ලෙස ය. සහ 1936-37 වාඩි ලා ගැනීමේ (සිට්ඩවුන් ස්ට්‍රයික්) රැල්ල ලෙස ය.

41. මේ වතාවේදී අර්බුදය වඩාත් වේගයෙන් දරන හරිනු ඇතැයි විශ්වාස කිරීමට බොහෝ හේතු පවතී. ප්‍රථමයෙන් ම, අර්බුදය ආරම්භවීමට ද පෙර ඇමරිකානු කම්කරු පන්තිය ජීවන තත්වයන්ගේ දිග් ගැසුනු එකතැන පල්වීම ද පිරිහීයාම ද අත්දැක තිබුනි. පසුගිය අවුරුදු 35 වෛෂයිකව අංග ලක්ෂිතව පැවැත්තේ සූරාකෑම උග්‍රවීමක් ලෙස ය. එපමනක් නොව, ඇමරිකානු පාලක ප්‍රභූන්ගේ කයිවාරුව සහ දඩබ්බරය කොතරම් දරුනු උවත් ඇමරිකානු ධනවාදය දැන් එලඹ ඇත්තේ 1930 ගනන්වලට පැවතුනාට වඩා ඓතිහාසික වශයෙන් ගත්කල බොහෝ දුෂ්කර තත්වයකට ය. එකල්හි "භීතිය හැර අප බියපත් වියයුතු අන් කිසිවක් ඇත්තේ නැති" යයි රූස්වෙල්ට් ප්‍රකාශ කරන කල්හි ඔහුට එසේ කීමට ඉඩ සලසන්නා වූ සමහර ඓතිහාසික සාධකයන් පැවතුනි. ට්‍රොට්ස්කි ඉතා මනාව පෙන්නුම් කල පරිදි ද රූස්වෙල්ට්ට ඔහුගේ අත්හදාබැලීම්වලට ඉඩ සලසන්නේ ඇමරිකාවේ සම්පත් ය." අද පවත්නා තත්වය මුලුමනින්ම වෙනස් ය. දශක ගනනාවක් තිස්සේ පහතට කැරකී ගමන් කොට ඇති ඇමරිකානු ධනවාදයේ ගමන් මග දැන් කඳු මුදුනින් ඇද වැටෙමින් පවතී.

42. ඇමරිකානු ධනවාදයේ ඓතිහාසික අර්බුදය කම්කරු පන්තියේ සමාජ විඥානයේ හා දේශපාලන දිශානතියේ වර්ධනය කෙරේ දුරදිග යන බලපෑමක් ඇති කරයි. අවසාන විග්‍රහයේ දී ගන්නා කල්හි කම්කරු පන්තියේ ප්‍රචන්ඩ අරගලයන්හි කාල පරිච්ඡේදය තුල පවා ඇමරිකාවේ සමාජ විඥානයේ වර්ධනය පිලිබඳ මහා ගැටලුව ඇමරිකානු ධනවාදයේ බලය සහ ආර්ථික වශයෙන් එය ලත් වරප්‍රසාදිත තත්වය පිලිබිඹු කලේ ය. "ඇමරිකානු සුවිශේෂතාවාදයේ" මෙම වෛෂයික පදනම - සමාජවාදයේ අභියෝගයට එරෙහිව ඇමරිකානු ධනවාදය දැක්වීමට සමත් වූ සුවිශේෂ ප්‍රතිරෝධය වනාහී - දැන් අතීතයට අයත් කරුනකි. ඉතිහාසය නිරන්තරව පෙන්නුම් කර ඇති පරිදි ගෝලීය පරිහානිය ද අර්ථික අර්බුදය ද අන්තර් ඡේදනය වීම විප්ලවයට ආරම්භක තල්ලුව සපයයි.

43. සමාජවාදී සමානතා පක්ෂයේ කර්තව්‍යයන් ගලා එන්නේ ඇමරිකානු සහ ලෝක ධනවාදයේ සමාජ ආර්ථික සහ දේශපාලන අර්බුදයේ තර්කනයෙනි. ගැඹුරුවන්නා වූ ලෝක අර්බුදය එක්සත් ජනපදයේ ද ජාත්‍යන්තරව ද කම්කරු පන්තිය සමාජ හා දේශපාලන වශයෙන් රැඩිකලීකරනය වීමකට මග පාදතැයි පක්ෂය විශ්වාස කරයි. මෙම රැඩිකලීකරනය වෘත්තීය සමිතිවල නිලධාරිවාදී ප්‍රතිගාමී විලංගුවලින් බිඳී නිදහස් වීමට ද වඩවඩාත් දේශපාලනික හා ප්‍රති ධනවාදී වූ මානයන් අත් කර ගැනීම ද වශයෙන් ප්‍රකාශිත වනු ඇත. මෙම ප්‍රවනතාවය දැනට මත් 2008 සිද්ධීන් තුල ප්‍රකාශිතව

පවතී. රිපබ්ලික් වින්ඩෝස් ඇන්ඩ් ඩෝස් සමාගම කම්කරුවන් විසින් අල්ලා ගැනීම වනාහී වැදගත් ඉදිරි පියවරකි; ඒ වනාහී ආර්ථික අර්බුදයට ප්‍රතිචාර වශයෙන් කම්කරුවන් කොටසක් විසින් ගන්නා ලැබූ ප්‍රථම ස්වාධීන පියවර වේ. ග්‍රීසියේ දී තරුනයෙකු මරා දැමීම මහා විරෝධතා ක්‍රියාවලට තුඩු දුන් අතර ඒ රටේ සමාජ අර්බුදය සමග අන්තර් ඡෙදනය වෙමින් පැතිරීයාමට පටන් ගති. මේවා වනාහී ආරම්භක ලකුනු පමනි. රටේ සෑම ප්‍රදේශයක ම ලෝකයේ සෑම තැනක ම මහා ජන අරගල වර්ධනය වනු ඇත. සමාජවාදී සමානතා පක්ෂයේ ද හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ද කර්තව්‍යය වන්නේ ඒවාට මැදිහත් වී නායකත්වය සැපයීම ය.

## සමාජවාදී සමානතා පක්ෂයේ දේශපාලන සූදානම

44. 2008 වර්ෂයේ දී, සමාජවාදී සමානතා පක්ෂය පන්ති අරගලයේ නව නැගඒමක් ද අපගේ ම ව්‍යාපාරයේ වැඩෙන්නා වූ බලපෑම ද පෙර දකිමින් එයට අදාලව තීරනාත්මක පියවර ගත්තේ ය. අගෝස්තුවේ දී - මූල්‍ය අර්බුදය පුපුරා යාමට සති කිහිපයකට පෙර - සසපය තම ප්‍රාරම්භක සම්මේලනය පැවැත්විය. හතරවන ජාත්‍යන්තරයේ ඉතිහාසයෙහි සැතපුම්කනුවක් වූ සම්මේලනය එක්සත් ජනපදයේ ද ජාත්‍යන්තරව ම ද දශකයකට වැඩි කාලයක් තිස්සේ කරන ලද න්‍යායික දේශපාලනික සහ සංවිධානාත්මක වැඩ කටයුතුවල ද ප්‍රතිඵලයක් විය. දීර්ඝ සාකච්ඡාවකට පසු සම්මේලනය අපගේ ප්‍රවනතාවයේ උරුමය කරා යමින් හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ද සමාජවාදී සමානතා පක්ෂයේ ද ක්‍රියාමාර්ගික අනන්‍යතාවය හා ඉදිරිදර්ශනයන් නීර්නය කරන්නා වූ තීරනාත්මක ඓතිහාසික සිද්ධීන්, දේශපාලන අරගල සහ න්‍යායික මතගැටුම් සමාලෝචනය කරයි. අප එහි දී අවධාරනය කලේ "විප්ලවවාදී සමාජවාදී මූලෝපායන්ට" වර්ධනය වී ගත හැක්කේ අතීත අරගලයන්ගේ පාඩම මත පමනක් ය යන්නය. අන් සියල්ලට මත් වඩා සමාජවාදීන් පුහුනු කිරීම යොමු විය යුත්තේ හතරවන ජාත්‍යන්තරයේ ඉතිහාසය පිලිබඳ සවිස්තර ඥානයක් වර්ධනය කිරීම දෙසට ය. මාක්ස්වාදය "අප්ඩේට්" (කලට ඔබිනව සකසා ගැනීම සඳහා) විවිධ සුලුධනේශ්වර දහරාවන් වෙතට හැරෙන සියලුම දෙනාට විරුද්ධව අප අවධාරනය කලේ මෙයයිඃ "සමාජවාදී විප්ලවයේ න්‍යායික හා දේශපාලන හී තුඩ ලෙස මාක්ස්වාදයේ සංවර්ධනය එහි වඩාත්ම සංවර්ධිත ප්‍රකාශනය අත්පත් කර ගත්තේ හතරවන ජාත්‍යන්තරය ඇරඹූ 1938 පටන් එය විසින් ස්ටැලින්වාදයට, ප්‍රතිසංස්කරනවාදයට සහ ට්‍රොට්ස්කිවාදය පිලිබඳව පැබ්ලෝවාදී සංශෝධනටන්ට ද අනෙකුත් සකලවිධ දේශපාලන අවස්ථාවාදයන්ට ද එරෙහිව කරන ලද අරගලයන් තුල ය."

45. සම්මේලනය විසින් සම්මත කර ගන්නා ලද සසපයේ මූලධර්ම ප්‍රකාශය පක්ෂයේ දේශපාලන අත්තිවාරම් සංක්ෂිප්තව ඉදිරිපත් කරයි. එය අපේ මූලික අරමුන මෙසේ තහවුරු කරයිඃ "සමාජවාදී සමානතා පක්ෂයේ ක්‍රියාමාර්ගය වනාහී නූතන ධනේශ්වර සමාජ තුල නායක සහ තීරනාත්මක ජාත්‍යන්තර සමාජවාදී බලවේගය වූ කම්කරු පන්තියේ අවශ්‍යතා පිලිබඳ පැහැදිලි ප්‍රකාශනයකි. සමාජවාදී සමානතා පක්ෂයේ කේන්ද්‍රීය කර්තව්‍යය වන්නේ ජාත්‍යන්තර සමාජවාදයේ ක්‍රියා මාර්ගය සඳහා ඇමරිකානු කම්කරුවන්ගේ සහාය දිනා ගැනීම ය." ධනේශ්වර පක්ෂ එකක් හෝ අනෙකා බලපෑම් මගින් වෙනස් කිරීමට යත්න දරන්නා වූ අයට එරෙහිව අප මෙසේ අවධාරනය කලෙමුඃ "ඇමරිකා එක්සත් ජනපදයේ දේශපාලන බලය අල්ලා ගැනීම සහ කම්කරු පන්ති රාජ්‍යයක් පිහිටුවීම සඳහා කම්කරු පන්තිය මෙම ක්‍රියාමාර්ගයේ පදනම මත ඒකාබද්ධ කිරීමට සහ බලමුලුගැන්වීමට සසපය යත්න දරයි. එය එමගින් සැබවින්ම ප්‍රජාතන්ත්‍රවාදී වූ ද සමානතාවාදී වූ ද සමාජවාදී වූ ද සමාජයක් වර්ධනය කිරීම සඳහා වෛෂයික පූර්ව කොන්දේසි නිර්මානය කරනු ඇත." සමාජවාදය කරා ජාතික මාවතක් ඇත්තේ නැත. මේ වනාහී ගෝලීය ධනේශ්වර අර්බුදයේ පුපුරායාම ද සමග ඕනෑවටත් වඩා හොඳින් පැහැදිලිවන්නා වූ කරුනකි. අපි මෙසේ කීමු, මෙම අරමුනු ජයග්‍රහනය කර ගත හැකි වන්නේ ජාත්‍යන්තර මූලෝපායක රාමුව තුල පමනකි. එහි අරමුන වන්නේ සියලු රටවල කම්කරුවන් භූගෝල පරිමානව ඒකාබද්ධ කොට එක්සත් ලෝක සමාජවාදී සමූහාන්ඩු සංගමයක් පිහිටුවීම ය. සම්මේලනය තම ඓතිහාසික අඛන්ඩතාවය ද ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ව්‍යුහය ද රැක ගන්නා අතර ම පක්ෂය තුලට නව බලවේගයන් ඒකාග්‍ර කර ගැනීම සඳහා අවශ්‍ය සංවිධානාත්මක රූපයන් තහවුරු කරන්නා වූ නව ව්‍යවස්ථාවක් ද සම්මත කර ගත්තේ ය.

46. කම්කරු පන්තියේ විප්ලවවාදී ගමනේ නව අවධියක දැනුවත් ප්‍රකාශනයක් වූ සසප ආරම්භක සම්මේලනය ඒ සමග ම හතරවන ජාත්‍යන්තරයේ ප්‍රවර්ධනයේ ඓතිහාසික සැතපුම් කනුවක් ද නියෝජනය කලේ ය. එහි දේශපාලන ඉදිරිදර්ශනය හා පන්ති දිශානතිය වශයෙන් ගත් කල්හි සසප සම්මේලනය ප්‍රතිට්‍රොට්ස්කිවාදී පැබ්ලෝවාදී සංවිධානයන් විප්ලවවාදී සමාජවාදී ක්‍රියාමාර්ගයකින් මුලුමනින්ම වෙන්වී ගැනීම සඳහා දරන ප්‍රයත්නයන් ට අශමනීය ලෙස ප්‍රතිවිරුද්ධව පිහිටා ගත්තේ ය. ප්‍රන්සයේ පැබ්ලෝවාදී සංවිධානය වන ලීග් කොමියුනිස්ට් රෙවලූෂනයර් (එල්සීආර්) විසින් ඊනියා "ධනේශ්වර විරෝධී පක්ෂය" (එන්පීඒ) තුලට දියවී ගැනීමට ගනු ලැබූ තීන්දු වනාහී 1953 හතරවන ජාත්‍යන්තරයෙන් බිඳී වෙන්වීමේ පටන් ට්‍රොට්ස්කිවාදයෙන් බිඳී වෙන්වීමේ සමස්ත ඉතිහාසයේ කූටප්‍රාප්තිය වේ. තමන් පිහිටුවන

අලුත් පක්ෂය ට්‍රොට්ස්කිවාදී නොවන බව ද එහි ක්‍රියාමාර්ගය ජාතිකවාදී පදනමක නිර්වචනය වන බව ද එල්සීආර් කියා සිටී. තමන්ගේ ප්‍රතිගාමී දිශාවනතිය වසං කර ගැනීම සඳහා පැබ්ලෝවාදී සංවිධානයන් පොදුවේ යොදා ගන්නා වංචනික, නරුම සහ ලිස්සන භාෂාවෙන් එල්සීආර් නායකයන් කියා සිටින්නේ, " ජාත්‍යන්තර කරුනු සම්බන්ධයෙන් තමන්ගේ ම පිලිවෙත් පාලනය කර ගන්නා වූ එම්පීජ් සංවිධානය ජාත්‍යන්තරවාදී සංවිධානයක් වන්නේ ය. වෙනත් වචනවලින් කිව හොත් නව පක්ෂයේ ජාත්‍යන්තරවාදය "නීර්නය කෙරෙනු ඇත්තේ" එම්පීජ් සංවිධානය විසින් සිය ජාතික අවශ්‍යතාවයන් මතය. මේ වර්ගයේ "ජාත්‍යන්තරවාදය" නම් කේ දි ඕර්සයේ (ප්‍රන්සයේ විදේශ කටයුතු අමාත්‍යංශයේ රාජ්‍යතාන්ත්‍රිකයන්ට ද ප්‍රන්ස ධනේශ්වර රාජ්‍යයට ද මුලුමනින්ම පිලිගත හැකි එකකි.)

47. එම්පීජ් සංවිධානයේ ජාත්‍යන්තර ක්‍රියා මාර්ගය පිලිබඳ ඉහත සඳහන් සූත්‍රය එල්සීආර් සංවිධානය විසුරුවාහැරීමට හේතුවූ දේශපාලන ආසක්තතාවන් මොනවා ද යන්න නීර්නය කර ගැනීම සඳහා යතුර සපයයි. එන්පීජ් සංවිධානය සහ (බ්‍රිතාන්‍යයේ කුරිරු ඉරනමකට පත් රෙස්පෙක්ට් පක්ෂය වැනි) එවන් වෙනත් සංවිධාන නිර්මානය කිරීම වනාහී ප්‍රධාන පැබ්ලෝවාදී නායකයන් (ක්‍රිවීන් සහ සබඩෝ යනාදී) විසින් ගැඹුරුවන්නාවූ සමාජ සහ දේශපාලන අර්බුදයක් තුල ධනේශ්වරයේ අවශ්‍යතාවයන්ට අනුව කරන ලද සෘජු සහ ඉතා දැනුවත් ප්‍රතිචාරයකි. ට්‍රොට්ස්කි එතරම් ම සුපැහැදිලිව පෙන්වා දුන් අයුරු නැග එන සමාජ කලබැගැනියට මුහුන දෙන ධනේශ්වර පන්තිය ආරක්ෂක කපාට (සේෆ්ටි වැල්ව) සහ අකුනු සනනායක (ලයිට්නිං කන්ඩක්ටර්ස්) තොග ගනනේ නිර්මානය කරයි; "හෙට නැතිවී යන නමුත්, අද දින ධනේශ්වරයට නොරිදවමින් තම කෝපය ප්‍රකාශ කිරීමේ හැකියාව පහල මධ්‍යම පන්තියට සලසාදීම මගින් තමන්ගේ කර්තව්‍යය ඉටුකරන්නා වූ, විරුද්ධ පක්ෂයන් පහල කරගනී." (*Terrorism and Communism* - ත්‍රස්තවාදය සහ කොමියුනිස්ට්වාදය (ලන්ඩන් නිව් පාක් 1975,) පි.53) එන්පීජ් ව්‍යාපෘතියේ ද වෙනත් එවැනි ප්‍රතිගාමී ව්‍යාපෘතීන්ගේ ද ප්‍රධාන අරමුන වන්නේ කම්කරු පන්තිය තුල සැබවින්ම මාක්ස්වාදීන්, එනම් ට්‍රොට්ස්කිවාදී නායකත්වයක් වර්ධනය වීම කෙසේ හෝ වලක්වාලීම ය.

## ලෝක සමාජවාදී වෙබ් අඩවිය

48. සසප සම්මේලනයෙන් මාස තුනක් ගතවීමට පෙර ඔක්තෝබර් 22 දා, ජාත්‍යන්තර කමිටුව ලෝක සමාජවාදී වෙබ් අඩවියේ නව සැකැස්ම ක්‍රියාත්මක කලේ ය. හුදෙක් තාක්ෂනික සහ සෞන්දර්යාත්මක වශයෙන් ගතහොත් මෙම නව සැකැස්ම වැදගත් ඉදිරි පියවරක් නියෝජනය කලේ ය. එහෙත් මෙම නව සැකැස්මේ සාරභූත අර්ථය දේශපාලන විය. එනම් වෛෂයික තත්වයේ වෙනස්කම් විසින් ද වේගයෙන් පලල්වන පාඨකයක් විසින් ඉස්මතු කරනු ලබන ඉල්ලීම්වලට සරිලන පරිදි ද ලෝක සමාජවාදී වෙබ් අඩවියේ වර්ධනයන් සිදු කල යුතු බවයි. නව වෙබ් අඩවිය ඉදිරිදර්ශන අංශයක් ඇතුලත් කර ගත්තේ ය. එම අංශය දවසේ කේන්ද්‍රීය දේශපාලන න්‍යායික සහ සංස්කෘතික ප්‍රයුක්තයන් නියමිත කොට හැඳින්විය. නව සැකැස්මකින් යුතු වෙබ් අඩවිය ඉදිරිපත් කරමින් කර්තෘ මන්ඩලය කරුනු මෙසේ පැහැදිලි කලේ යඃ

> ලෝක සමාජවාදී වෙබ් අඩවියේ කර්තව්‍යයන් සහ දේශපාලන දිශානතිය දිග හැරෙන අර්බුදයේ වෛෂයික ගම්‍යයන් පිලිබඳ තක්සේරුවකින් ඇරඹේ. කොටින් කිවහොත් ජාත්‍යන්තර කර්තෘ මන්ඩලය පහත සඳහන් දෑ මත පිහිටා සිටීඃ
>
> 1. ඇමරිකා එක්සත් ජනපදය කේන්ද්‍ර කර ගත් ගෝලීය මූල්‍ය අර්බුදය ලෝක ධනේශ්වර පද්ධතියේ ඓතිහාසික අර්බුදයේ තීරනාත්මක සන්ධිස්ථානයක් සලකුනු කරයි. ධනේශ්වර නිෂ්පාදන ක්‍රමයේ ආවේනික හා නොවිසඳිය හැකි ප්‍රතිසතිතාවන් පිලිබඳ මාක්ස්වාදී විශ්ලේශනයකින් සිත් කාවදින ලෙස සනාථ වී පවතී.
>
> 2. ගැඹුරුවන්නා වූ ආර්ථික අර්බුදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදී සහ ධනේශ්වර රටවල් අතර දැනට ම සැහෙන මට්ටමකට නැගගෙන ඇත්තා වූ ආතතීන් තව දුරටත් උග්‍ර කරනු ඇත. නිෂ්පාදන බලවේගයන්ගේ ජාත්‍යන්තරව ඒකාග්‍රවූ වර්ධනය සහ ජාතික රාජ්‍ය පද්ධතිය අතර පවත්නා මූලික ඓතිහාසික ඝට්ටනය වඩවඩාත් විවෘත ලෙස ලෝක පරිමාන යුද්ධයක් පිලිබඳ අන්තරාය වඩවඩාත් ඉස්මතු කරයි. තම දිග් ගැස්සුනු අර්බුදය විසින් දැනට ම යස රඟට එලිදරව් කොට ඇති ඇමරිකා එක්සත් ජනපදයේ ආර්ථික තත්වයේ පිරිහීම ජය ගැනීමට එරට දරන්නා වූ ප්‍රයත්නය එන්න එන්නම වැඩිවැඩියෙන් ඉවබව නැති හා සීමා රහිත යුදවාදී ස්වභාවයක් අත්පත් කර ගනු ඇත.
>
> 3. පුපුරන්නාවූ ලෝක ආර්ථික තත්වය ලෝක පරිමානව පන්ති අරගලයේ අලුත් ඉහල නැගීමකට අනිවාරනීයව මග පාදා ඇත. පන්ති අරගලය වලක්වා එය පාවාදීම සඳහා පැරනි හා දූෂිත නිලධාරිවාදී සංවිධානය දේශපාලන පක්ෂ හා වෘත්තීය සමිති - දරන්නවූ ප්‍රයත්නයට එරෙහිව වැඩෙන අධිෂ්ටානයෙන් යුතුව කම්කරු පන්තිය තම ප්‍රතිරෝධය දක්වනු ඇත.

4. අලුතින් රැඩිකලීකරනය වූ කම්රුවන්, ශිෂ්‍යයන්, තරුනයන් සහ බුද්ධිමතුන් අතර, හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ මාක්ස්වාදී න්‍යාය සහ විප්ලවවාදී සමාජවාදයේ ඉදිරිදර්ශනය සහ ක්‍රියාමාර්ගය සඳහා නව ශ්‍රාවකයක් පැන නගිනු ඇත. නව විප්ලවවාදී යුගයේ අභියෝගයට මුහුන දීමට සමත් වනු ඇත්තේ මාක්ස්වාදී න්‍යාය මත දැඩිව පදනම් වූවා වූ ද ට්‍රොට්ස්කිවාදයේ උරුමය ඒකායනව ආරක්ෂා කරන්නා වූ ද පක්ෂයකට ම පමනි.

වර්ධනය වන්නාවූ අර්බුදය පිලිබඳ මෙම තක්සේරුව මත පදනම් වූ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලය, කම්කරුවන්ගේ බලය සහ සමාජවාදය පිහිටුවීම සඳහා කරනු ලබන අරගලයේ ප්‍රමුඛ ඉදිරි පියවරක් ලෙස ලෝක සමාජවාදී වෙබ් අඩවිය යලි සකසා යලි දියත් කිරීම ම දැකගනී.

49. හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව සහ සමාජවාදී සමානතා පක්ෂය, දැනට ම ලෝකයේ වඩාත් පෘථුලව කියවනු ලබන්නා වූ සමාජවාදී වෙබ් අඩවිය වන ලෝක සමාජවාදී වෙබ් අඩවියේ පාඨක සංඛ්‍යාව නොනැවතී සහ සැලකිය යුතු පරිදිදෙන් වර්ධනය වනු ඇතැයි දැකගනී. අපගේ අරමුන වන්නේ මෙම වෙබ් අඩවිය ඇමරිකාවේ සහ ජාත්‍යන්තරව කම්කරු පන්තිය සමාජවාදය සඳහා අරගලය උදෙසා දේශපාලනමය බුද්ධිමය සහ සංවිධානාත්මක මධ්‍යස්ථානය ලෙස වර්ධනය කිරීමය.

50. අපගේ දිශාවනතිය වන්නේ සමාජවාදය සඳහා අරගලයේ ප්‍රධාන ජනතා විප්ලවවාදී බලය ලෙස ඇමරිකානු සහ ජාත්‍යන්තර කම්කරු පන්තිය දෙසට ය. ජාත්‍යන්තර ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ ඉතිහාසය සහ සම්ප්‍රදාය තුල මුල් බැසගත්තාවූ මෙම ඉදිරිදර්ශනය ම මෙම ග්‍රහලෝකය තුල අනෙකුත් සියලු දේශපාලන ප්‍රවනතාවන්ගෙන් අපව වෙන් කොට පිහිටුවයි. සමාජවාදී සමානතා පක්ෂය කම්කරු පන්තිය තුල එහි ක්‍රියාකාරිත්වය වර්ධනය කරමින් විරැකියාවට, වැටුප් කප්පාදුවට, සමාජ තත්වයන්ට එරෙහි ප්‍රහාරයන්ට විරුද්ධව ද ඇමරිකානු අධිරාජ්‍යවාදයේ මිලිටරිවාදී පිලිවෙත්වලට විරුද්ධව ද ජාත්‍යන්තර කමිටුව හා ඒකාබද්ධව සටන්වදී. අපි සමාජවාදී සමානතා පක්ෂය සහ හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවට බද්ධවූ තරුන ව්‍යාපාරය වන සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයන්ගේ ක්‍රියාකාරිත්වය පලල් කරමින් අද තරුනයින් මුහුන දී සිටින්නා වූ හදිසි සමාජ දේශපාලන ගැටලු - උග්‍ර වන නය, යහපත් රැකියා නැතිකම යුද්ධය හා යුද්ධයට බලහත්කාරයෙන් බඳවා ගැනීම යනාදියට - පිලිතුර ඉදිරිපත් කොට තරුනයන් සමස්ත වශයෙන් කම්කරු පන්තිය දෙසට යොමු කරන්නෙමු. කම්කරු පන්තිය දෙසට වූ මෙම හැරීගැනීම සමීපව බැඳී පවත්නේ මාක්ස්වාදය සඳහා ද අපෝහක භෞතිකවාදය සඳහා ද අරගලය සමග ය; අපගේ ව්‍යාපාරය එහි සමස්ත ඉතිහාසය තුල එයට මග පෙන්වූ න්‍යායික සංකල්පයන්ගෙන් කම්කරුවන් හා තරුනයන් පරපුරක් පුහුනු කරගැනීමට ය.

51. 2009 දී සමාජවාදී සමානතා පක්ෂය සමාජවාදයේ අවශ්‍යතාවය ඔප්පු කිරීමට තර්ක කරනු ඇත. කම්කරුවන් මුහුන දෙන්නා වූ සියලු හදිසි ප්‍රශ්න - ආර්ථික අර්බුදය, පෘථුල විරැකියාව සහ දිලිඳුකම, ලෝක යුද්ධයක අන්තරාය සහ අලුත් නව යටත්විජිතවාදී අපරාධ ඒකාධිපතිත්ව තර්ජනය - යන මේ සියල්ල ධනවාදයේ රාමුව තුල විසඳිය නොහැකිය යන්න අපි කම්කරුවන්ට පැහැදිලි කරන්නෙමු. එසේ ම අපකීර්තියට හා අර්බුදයට පත්වූ ජාත්‍යන්තර ධනවාදය අවසන් කොට ඒ වෙනුවට භූගෝල පරිමානව ඒකාග්‍රිත වූ ද පුද්ගලික ලාභය නොව සමාජීය අවශ්‍යතාවය ඉටු කරන්නා වූ ද සැලැස්මක් මගින් දැවැන්ත නිෂ්පාදන බලවේගයන් ප්‍රජාතන්ත්‍රවාදීව පාලනය කරන්නා වූ ද භූගෝල පරිමානව සම්බන්ධිත වූ ආර්ථික සැලැස්මක් පිහිටුවාලීමේ අවශ්‍යතාවය අපි තහවුරු කරන්නෙමු. අවශ්‍යව පවතින්නේ භූගෝලීය සමාජය විප්ලවවාදීව පරිවර්තනය කිරීම තම අරමුන කොට ගත්තා වූ කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන පක්ෂයක් ගොඩනැගීම ය.

52. ඉතිහාසය යලිත් වරක් තියුනු නැගුමක් ගෙන ඇත. ගතවූ මාස දොලහ වෛෂයික තත්වයේ අත්‍ය'සාමාන්‍යවූ ප්‍රතිවර්තනයක් අත්දුටුවේ ය. මානව වර්ගයා ලෝක පරිමානව මානව වර්ගයාගේ ඉරනම තීන්දුකරන්නා වූ දේශපාලන කම්පනයන්ගේ ද සමාජ අරගලයන්ගේ ද නව කාලපරිච්ඡේදයකට පිවිසෙමින් සිටී. ලෝක සමාජවාදී විප්ලවය සඳහා වෛෂයික අවශ්‍යතාවයෝ අතිශය ආන්තික වේගයකින් ඉදිරියට පැමිනෙමින් සිටිති. එහෙයින් ආත්මීය සාධකයේ එනම් විප්ලවවාදී පක්ෂයේ භූමිකාව තීරනාත්මක ඓතිහාසික අර්ථභාරයක් දරයි. වෛෂයික තත්වයේ මුහුකුරා යාම හා කම්කරු පන්තියේ විඥානයේ පවත්නා තත්වය අතර පවත්නා අගාධය තරනය කල යුතු ය. අන් සියල්ටමත් වඩා මෙය විසින් ඉල්ලා සිටින්නේ සසපයට කම්කරුවන් හා තරුනයින් බඳවා ගැනීම ද මාක්ස්වාදී න්‍යාය සහ හතරවන ජාත්‍යන්තරයේ ඉතිහාසයේ පදනම මත ඔවුන් දේශපාලනිකව පුහුනු කරගැනීම ද වේ. 2009 වර්ෂය තුල දී හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ද සමාජවාදී සමානතා පක්ෂයේ ද සකල ප්‍රයත්නය ම යොමු කල යුත්තේ මෙම කටයුත්ත සඳහා ය.

© www.wsws.org